# වැලිමඩ ප්‍රාදේශීය සභාවේ මහ සභා රැස්වීම් වාර්තාව - 2025.08.28

**පිළිගැනීම**

2025 වර්ෂයේ අගෝස්තු මස 28 වන බ්‍රහස්පතින්දා දින පෙ.ව.09.00 ට මුලාසනය දැරූ ගරු සභාපතිතුමා විසින් ගරු උප සභාපතිතුමා, ගරු මන්ත්‍රී මණ්ඩලය , සභා ලේකම්තුමා , කාර්ය මණ්ඩලය හා මාධ්‍යවේදී මහතුන් ඇතුළු සියළු දෙනා පිළිගැනීමෙන් අනතුරුව සභාවේ වැඩ කටයුතු ආරම්භ කරන ලදි.

**පැමිණීම**

**සහභාගි වූ ගරු මන්ත්‍රීවරුන්ගේ නාම ලේඛනය**

1. ගරු සභාපති ඩී.එම්. අජිත් කුමාර මැතිතුමා
2. ගරු උපසභාපති එම්.එල්.එම්. සෆ්වාන් මැතිතුමා
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා
4. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා
5. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා
6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා
7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.වී.එන්.කුසුම් කුමාරි මැතිණිය
8. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මොහොමඩ් අලිම් මොහොමඩ් ෆායිස් සයිබු මැතිතුමා
9. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්.අජිත් ප්‍රේමලාල් මැතිතුමා
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටි.එම්.චන්ද්‍රිකා තෙන්නකොන් මැතිණිය
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. මහේෂ් කෝසල රාජකරුණා මැතිතුමා
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙණිය මැතිතුමා
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ. චන්දක වීරසේන මැතිතුමා
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.කේ. ලලිත් පද්මසිරි විජය නන්ද මැතිතුමා
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. උදයකුමාර් මැතිතුමා
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.පී. චිත්‍රා ජයසිංහ පතිරණ මැතිණිය
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්.එම්.එම්.පී.ජමිත් මැතිතුමා
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්ලිව්. චාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිණිය
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.ජී. ධනුෂ්ක තිලකසිරි මැතිතුමා
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.එම්. චන්ද්‍රසේකර මැතිතුමා
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එන්.එම්. කරුණාදාස මැතිතුමා
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.එම්. චාමර ප්‍රසාද් ගුණසේකර මැතිතුමා
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.එම්.රාසීක් මැතිතුමා
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ. එම්. හුසෙයින් මැතිතුමා
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.එම්. ප්‍රේමරත්න මැතිතුමා
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. දනිෂා මැතිණිය
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. මුත්තුකුමාර් මැතිතුමා
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.එම්. පත්මිණි දිසානායක මැතිණිය
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්. සිත්ති උසෙයිමා මැතිණිය
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්. වසන්ත කුමාරන් මැතිතුමා

35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසිජ් මැතිතුමා
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. තාහිර් මහරූෆ් මැතිතුමා
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. ජබාර් තුවාන්කාසිම් මැතිතුමා
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.ඒ.ඩී. අමිත අමරසූරිය මැතිතුමා
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී. චූලනී ජයමාලි මැතිණිය
41. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා
42. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා
43. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ශාන්තා ප්‍රසාදි දේශානි මැතිණිය
44.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.එම්. කුසුමාවතී මැතිණිය

**01.පසුගිය මහ සභා රැස්වීම් වාර්තාව සහා සම්මත කිරිම .**

ගරු සභාපතිතුමා විසින් පසුගිය සභා වාර්තාව සංශෝධන ඇත්නම් ඉදිරිපත් කර සභා සම්මත කර ගන්නා ලෙස ඉල්ලා සිටින ලදි.

ඒ අනුව 2025.07.31 වන දින මහා සභා රැස්විම් වාර්තාව **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.වී.නිලුකා කුසුම් කුමාරි මැතිනියගේ හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.උදයකුමාර් මැතිතුමාගේ** යෝජනා ස්ථීරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**2. ගරු සභාපතිතුමා විසින් කරන ලද නිවේදන,**

I. ආපදා කළමනාකරණ විෂය පිළිබඳ පලාත් පාලන ආයතන නියෝජිතයින් දැනුවත් කිරිමේ වැඩමුළුව 2025.09.12 වන දින සභා ගර්භයේ දි පෙ:ව: 9.00ට පැවැත්වෙන බව දැන්වීම.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.වසන්ත කුමාරන් මැතිතුමා** හා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජේ.එම්.ඉන්දික සම්පත් මැතිතුමා** පෙ.ව 09.07ට සභාවට පැමිණෙන ලදි.

II. එක් කොට්ඨාශයකට එක් සංවර්ධන යෝජනාවක් බැගින් වන සේ 2026 අයවැය ලේඛණයට ඇතුළත් කිරිම සඳහා සංවර්ධන යෝජනා 2025.09.09 දිනට පෙර ලබා ගැනිම පිළිබඳ නිවේදනය

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එච්. අබ්දුල් හසිම් මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්. සිසිර දිලාන් ජයතිලක මැතිතුමා , ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එම්.ඉන්දික සේනාරත්න මැතිතුමා** හා **ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්.එම්.ප්‍රභාත් රවීන්ද්‍ර ගුණසේකර මැතිතුමා** පෙ.ව 09.10ට සභාවට පැමිණෙන ලදි.

III. පළාත් පාලන අමාත්‍යාංශය විසින් "පුනරුදයේ උෟව පුරවරය "යන තේමාව යටතේ සැප්තැම්බර් මස 15 වන දින සිට 21වන දින දක්වා පළාත් පාලන සතියක් නම් කර ඇති බැවින් ඒ පිළිබඳව ගරු මන්ත්‍රීතුමන්ලා ,තුමියන්ලා දැනුවත් කිරීමේ වැඩමුළුවක් 2025.09.09 දින පෙ:ව:9.00ට සභා ගර්භයේදී පැවැත්වෙන බව දැන්වීම

**3. ප්‍රාදේශීය සභාව අමතා එවන සන්දේශ/පැමිණිලි/පෙත්සම්/සන්නිවේදන ලිපි - නැත**

**4. යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න**

**I. ප්‍රාදේශිය සභා මන්ත්‍රී ජී.ජී. ධනුෂ්ක තිලකසිරි මැතිතුමා විසින් ගෙන එන ප්‍රාදේශිය සභාව සතු මාර්ග පිළිබඳ ප්‍රශ්නාවලිය**

1. **වැලිමඩ ප්‍රාදේශිය සභාව මඟින් නඩත්තු කළයුතු යැයි සම්මත මාර්ග ප්‍රමාණයන් කිලෝමීටර් කොපමණද?**
2. **ඒවා අතුරෙන් මහජනතාවට පරිහරණයට සුදුසු ලෙස කාපට් හෝ කොන්ක්‍රීට් අතුරා සකස් කරන ලද මාර්ග ප්‍රමාණයන් කොපමණද?**
3. **දැනට මහජන පරිහරණයට සුදුසු ලෙස සකස් නොකරන ලද මාර්ග ප්‍රමාණයන් කොපමණද?**

ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා ලිඛිත පිළිතුරු සභාවට ඉදිරිපත් කරන ලදි.

**ප්‍රශ්න අංක 01 සඳහා පිළිතුරු,**

වැලිමඩ ප්‍රාදේශිය සභාව මඟින් නඩත්තු කළයුතු යැයි සම්මත මාර්ග ප්‍රමාණයන් කිලෝමීටර් **291.41**

**ප්‍රශ්න අංක 02 සඳහා පිළිතුරු,**

එම මාර්ග අතුරෙන් මහජනතාවට පරිහරණයට සුදුසු ලෙස කාපට් හෝකොන්ක්‍රීට් අතුරා සකස් කරන ලද මාර්ග ප්‍රමාණය

**තාර - 7 . 9 km** **කොන්ක්‍රීට් - 202.41 km**

**ප්‍රශ්න අංක 03 සඳහා පිළිතුරු,**

දැනට මහජන පරිහරණයට සුදුසු ලෙස සකස් නොකරන ලද මාර්ග ප්‍රමාණය

**පස් - 7 km** **බොරළු - 74.1 km**

**(දැනට පවතින යාවත්කාලීන නොවූ මාර්ග ලේඛනයෙහි සඳහන් තොරතුරු අනුව ඉහත ප්‍රශ්නාවලියට අදාළ පිළිතුරු ලබා දී ඇති බව දන්වමි.)**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රිනි සිත්ති හුසෙයිමා** මැතිනිය 09.15ට සභාවට පැමිණෙන ලදි.

**II. ප්‍රාදේශිය සභා මන්ත්‍රී එන්.එම්.කරුණාදාස මැතිතුමා විසින් ගෙන එන ප්‍රාදේශිය සභාව සතු ක්‍රීඩා පිට්ටනි පිළිබඳ ප්‍රශ්නාවලිය**

1. **ප්‍රාදේශිය සභාව සතු සම්පූර්ණ ක්‍රීඩා පිට්ටනි ගණන කොපමණද?**
2. **එම ක්‍රීඩා පිට්ටනි වල විශාලත්වය කොපමණද?**
3. **එම ක්‍රීඩා පිට්ටනි නඩත්තු කිරිමට ප්‍රාදේශිය සභාව ගෙන ඇති පියවර මොනවද?**
4. **මෙම ක්‍රීඩා පිට්ටනි අතරින් ආරවුල් සහිත ක්‍රීඩා පිට්ටනි තිබේද?**

5. **තිබේනම් ඒ ආරවුල් නිරාකරණය කිරිමට ගත් පියවර මොනවාද?**
6. **ඉදිරියේ දි ප්‍රාදේශිය සභාව බල ප්‍රදේශය තුල ක්‍රිඩා පිට්ටනි ආරම්භ කිරිමට බලාපොරාත්තු වන්නේ ද?**

   ඒ අනුව ගරු සභාපතිතුමා විසින් ඒ සඳහා ලිඛිත පිළිතුරු සභාවට ඉදිරිපත් කරන ලදි.

**ප්‍රශ්න අංක 01 සදහා පිළිතුරු,**

**දැනට හඳුනා ගත් සභාව සතු ක්‍රීඩා පිටි ප්‍රමාණය** - 04 කි.

* කැප්පෙටිපොල ක්‍රීඩා පිටිය

* පළතුරුවත්ත ක්‍රීඩා පිටිය

* පෙල්ලිවින්න ක්‍රීඩා පිටිය

*ගුරුතලාව ක්‍රීඩා පිටිය

**ප්‍රශ්න අංක 02 සදහා පිළිතුරු,**

**එම ක්‍රීඩා පිටිවල විශාලත්වය**

* කැප්පෙටිපොල කරගස්වගුර ක්‍රීඩා පිටිය - මුළු ඉඩම අක්. 04 රූඩ - පර්.12

* පළතුරුවත්ත ක්‍රීඩා පිටිය - අක්.01 රූඩ 01

*පෙල්ලිවින්න ක්‍රිඩා පිටිය - මැනුම් කටයුතු සිදු කර නොමැත

*ගුරුතලාව ක්‍රීඩා පිටිය - මැනුම් කටයුතු සිදු කර නොමැත

**ප්‍රශ්න අංක 03 සදහා පිළිතුරු,**

**එම ක්‍රීඩා පිට්ටනි නඩත්තු කිරීමට ප්‍රාදේශිය සභාව ගෙන ඇති පියවර**

*දැනට නඩත්තු කටයුතු සිදුකරමින් පවති,වැසිකිළි පද්ධතිය ඉදි කර නඩත්තු කෙරේ, ප්‍රේක්ෂාකාගාරය ඉදිකිරීමේ කටයුතු ආරම්භ කර ඇත.

*පළතුරුවත්ත ක්‍රීඩා පිටියේ වේදිකාව ප්‍රාදේශිය ලේකම් කාර්යාලය විසින් ඉදි කරන ලද අතර, එය දැනට කඩා වැටී ඇත. එය අලුත් වැඩියා කිරීමට යෝජනා වි ඇත.

**ප්‍රශ්න අංක 04 සදහා පිළිතුරු,**

**ක්‍රිඩා පිට්ටනි අතරින් ආරවුල් සහිත ක්‍රීඩා පිට්ටනි** නැත.

**ප්‍රශ්න අංක 05 සදහා පිළිතුරු,**

**තිබේ නම් ඒ ආරවුල් නිරාකරනය කිරීමට ගත් පියවර මොනවාද? නැත.**

**ප්‍රශ්න අංක 06 සදහා පිළිතුරු, ඉදිරියේදි ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ**

*ඕලු ගංතොට ආයුර්වේද රෝහලට යාබදව පිහිටි ක්‍රීඩා පිටිය

* එසේම ඉදිරියේදී හදුනාගත් ඉඩම්වල ක්‍රීඩා පිට්ටනි ආරම්භ කිරීමට බලාපොරොත්තු වේ.

05.යථාපරිදි කල් දී ඇති යෝජනා

**ගරු සභාපතිතුමාගේ යෝජනා**

**යෝජනා අංක 01**

**01.2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවීමට අදාළ යෝජනාව.**

<u>**යෝජනාව**</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 134 වන වගන්තියේ (1 වන) උප වගන්තියෙන් ප්‍රාදේශිය සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාර දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කිරිමට වැලිමඩ ප්‍රාදේශිය සභාව විසින් ගනු ලැබු සභා සම්මුතියට බදුල්ල දිස්ත්‍රික්කයේ ප්‍රාදේශිය පළාත් පාලන කොමසාරිස්වරයාගෙන් ලද අනුමැතිය අනුව සහ එකි පනතේ 146 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාර වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශ ඇතුළත දියුණු කළ ප්‍රදේශ ලෙස ප්‍රකාශයට පත් කර ඇති සියලුම නිවාසවල, ගොඩනැගිලිවල, ඉඩම් වල හා ගෙවල් වල 2025 වර්ෂයේ වාර්ෂික වටිනාකම 2026 වර්ෂය සඳහා පිළිගැනිමටත් ,

එකී ප්‍රාදේශිය සභා පනතේ 134 වන වගන්තියේ (1) වන උප වගන්තියෙන් ලැබී ඇති බලතල ප්‍රකාර එකී දේපළ මත වැලිමඩ ප්‍රාදේශිය සභ බල ප්‍රාදේශය ඇතුළත පිහිටි සැම නිශ්චල දේපළක වාර්ෂික වටිනාකමින් (3.5%) ක වරිපනමක් 2026වර්ෂය සඳහා පනවා අය කිරිමටත්, සහ

ඒ වරිපනම්, එකී ප්‍රාදේශිය සභා පනතේ 134 වන වගන්තියේ (6) වන උප වගන්තියේ විධි විධාන යටතේ එකී වර්ෂයේ මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, හා දෙසැම්බර් 31, යන දින වලින් අවසන් වන කාර්තු හතර තුළදි සමාන වාරික හතරකින් ගෙවිමට විධාන කිරිමටත්,සුදුසු බවට යෝජනා කරමි.

තවද, මෙම පනතේ 134(7) වැනි වගන්තිය ප්‍රකාර එකී වාර්ෂික බදු මුදල සම්පූර්ණයෙන් ගෙවු විට පහත දැක්වෙන වට්ටම් මුදල් ප්‍රදානය කරන බවද දැනුම් දෙනු ලැබේ.

(අ) 2026 ජනවාරි මාසයේ 31 වන දිනට හෝ ඊට පෙර මුළු වර්ෂයටම ගෙවිය යුතු වරිපනම් බදු මුදල ගෙවනු ලැබුවහොත් එම මුදලින් 10% කි.

(ආ) බදු මුදල කොටස් වශයෙන් ගෙවන විට වරිපනම් බද්ද ගෙවිය යුතු කාර්තුවේ පළමු වන මාසය තුළ

ගෙවනු ලැබුවහොත් එසේ ගෙවන මුදලින් (3.5%) කි.

## 2026 වර්ෂය සඳහා වරිපනම් බදු පැනවිම.

| <u>වැලිමඩ ප්‍රධාන කාර්යාලය</u> | |
|---|---|
| දිවිතොටවෙල කන්ද පාර-වම | අංක03-29/22 දක්වා ද |
| දිවිතොටවෙල කන්ද පාර-දකුණ | අංක10-60 දක්වා ද |
| 01 පටුමඟ-දිවිතොටවෙල කන්ද පාර-වම | අංක05-29 දක්වා ද |
| 01 පටුමඟ දිවිතොටවෙල කන්ද පාර-දකුණ | අංක02-30 දක්වා ද |
| 02-පටුමඟ දිවිතොටවෙල කන්ද පාර-වම | අංක03-39 දක්වා ද |
| 02- පටුමඟ දිවිතොටවෙල කන්ද පාර-දකුණ | අංක02-28 දක්වා ද |
| රෝහල පාර-වම | අංක15-35 දක්වා ද |

| | |
|---|---|
| රෝහල පාර-දකුණ | අංක08-20/10 දක්වා ද |
| හේමපාල මුනිදාස මාවත-වම | අංක111/8 - 327 දක්වා ද |
| හේමපාල මුනිදාස මාවත--දකුණ | අංක2/C - 348 දක්වා ද |
| බොරලන්ද පාර-වම | අංක07-77 දක්වා ද |
| බොරලන්ද පාර-දකුණ | අංක04-94 B 1/1 |
| බෞද්ධ මන්දිර පාර-වම | අංක03-39 1/1 දක්වා ද |
| බෞද්ධ මන්දිර පාර-දකුණ | අංක 02-58 2/1 දක්වා ද |
| බණ්ඩාරවෙල පාර-වම | අංක 07-51/5 දක්වා ද |
| බණ්ඩාරවෙල පාර-දකුණ | අංක 10-10 b දක්වා ද |
| බදුල්ල පාර-වම | අංක01-563 දක්වා ද |
| බදුල්ල පාර-දකුණ | අංක02-270 දක්වා ද |
| මොරගොල්ල පාර-වම | අංක 01-33/1 දක්වා ද |
| මොරගොල්ල පාර-දකුණ | අංක02-12 දක්වා ද |
| නුවරඑළිය පාර-වම | අංක01-311 දක්වා ද |
| නුවරඑළිය පාර-දකුණ | අංක02-362 දක්වා ද |
| පටිටිය මැදවත්ත පාර-වම | අංක11-31 දක්වා ද |
| පටිටියමැදවත්ත පාර-දකුණ | අංක 08-44 A දක්වා ද |
| රැරාව පාර-වම | අංක 01-19 දක්වා ද |
| රැරාව පාර-දකුණ | අංක 04-8/3 දක්වා ද |
| වැලිමඩවත්ත පාර-දකුණ | අංක 02-20/24 දක්වා ද |
| | |
| කැප්පෙටිපොල උප කාර්යාලය | |
| බොරලන්ද පාර - වම | අංක 05 - 37/1 දක්වා ද |
| බොරලන්ද පාර - දකුණ | අංක 02 - 62 දක්වා ද |
| නුවරඑළිය පාර -වම | අංක 01 – 177 දක්වා ද |
| නුවරඑළිය පාර -දකුණ | අංක 02 – 202 දක්වා ද |
| වැලිමඩ පාර -වම | අංක 25 – 66/2 දක්වා ද |
| වැලිමඩ පාර - දකුණ | අංක 4 -60 1/1 දක්වා ද |
| | |
| බෝගහකුඹුර උප කාර්යාලය | |
| 1වන පටුමග වැලිමඩ පාර වම | අංක 13-31/1/1 දක්වා ද |
| 1වන පටුමග වැලිමඩ පාර දකුණ | අංක 06-46 දක්වා ද |
| අඹගස්දෝව පාර වම | අංක 05-119 දක්වා ද |
| අඹගස්දෝව පාර දකුණ | අංක 06-148/1 දක්වා ද |
| බෝගහකුඹුර ගම පාර වම | අංක 11-33 දක්වා ද |
| බෝගහකුඹුර ගම පාර දකුණ | අංක 06-42 දක්වා ද |
| බොරලන්ද පාර වම | අංක 3-89 දක්වා ද |
| බොරලන්ද පාර දකුණ | අංක 6-102 දක්වා ද |
| වැලිමඩ පාර වම | අංක 5-109 දක්වා ද |
| වැලිමඩ පාර දකුණ | අංක 4-126 දක්වා ද |

| |
|---|
| (අ) වැලිමඩ ප්‍රදේශය තුල පිහිටි දේපළ වල වාර්ෂික වටිනාකමින් 3.5% බැගින්ද |
| (ආ) කැප්පෙටිපොල උප කාර්යාල ප්‍රදේශය තුළ පිහිටි ප්‍රකාශිත ප්‍රදේශ වල ඇති දේපළ වෙනුවෙන් 3.5% බැගින්ද, |
| (ඇ) බෝගහකුඹුර උප කාර්යාල ප්‍රදේශ තුළ පිහිටි ප්‍රකාශිත ප්‍රදේශවල ඇති දේපළ වෙනුවෙන් 3.5% බැගින් ද, |

| |
|---|
| (ඇ) වරිපනම් ලේඛනයේ නම් සංශෝධනය කිරීමේ අයදුම්පත්‍ර ගාස්තු රු: 1700, හා එයට අදාළ පරීක්ෂණ ගාස්තු රු.300.00ක් ලෙසද, |
| (ඉ) නගරය හා නගර සීමාවෙන් පිට නිකුත් කරනු ලබන විථිරේඛා ගාස්තුව රු.1500.00,එයට අදාළ පරීක්ෂණ ගාස්තු රු.200.00 ක් ලෙසද,අය කර ගැනීම. |

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ආර්.එම්.දුෂාන්ත ඉන්දික රන්දෙනිය මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01.I 2026 වර්ෂය සඳහා ප්‍රචාරක දැන්වීම් සඳහා ගාස්තු අය කිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීම.**

<u>යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ (I) වන වගන්තියේ හා 1988.06.23 වන දින අංක 520/7 දරණ අති විශේෂ ගැසට් පත්‍රයේ පළාත් පාලන නිවාස හා ඉදිකිරීම් ගරු අමාත්‍යතුමා විසින් අනුමත කොට ප්‍රකාශයට පත් කොට ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවේ 39 වන කොටසේ ප්‍රචාරක දැන්වීම්/දෘශ්‍ය පරිසරය පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ විධි විධාන ප්‍රකාර ව වැලිමඩ ප්‍රාදේශිය සභා සීමාව තුළ කිනම් ආකාරයක හෝ පෙනෙන පරිදි දැන්වීමක් ප්‍රදර්ශනය කිරීමට සැලැස්වීම වෙනුවෙන් පහත උප ලේඛණයේ සඳහන් ගාස්තුවක් 2026.01.01 දින සිට අය කිරීමට යෝජනා කරමි.

## 2026 සඳහා ප්‍රචාරක දැන්වීම්

| අනු අංකය | උපලේඛණය | ගාස්තුව(වර්ග අඩියක් සඳහා) |
|---|---|---|
| 01 | කිසියම් බිත්තියක හෝ පුවරුවක හෝ බැම්මක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්විමක් සඳහා වර්ග අඩි100 කට වැඩි (ලිත් වර්ෂයක් සඳහා) | රු:150.00 |
| 02 | කිසියම් බිත්තියක හෝ පුවරුවක හෝ බැම්මක ප්‍රදර්ශනය කරනු ලබන ස්ථිර ප්‍රචාරක දැන්විමක් සඳහා වර්ග අඩි100 කට අඩු (ලිත් වර්ෂයක් සඳහා) | රු.200.00 |
| 03 | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්විමක් වෙනුවෙන් මාස තුනකට අඩු කාලයක් සඳහා | රු:175.00 |
| 04 | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්විමක් වෙනුවෙන් මාස තුනකට වැඩි එහෙත් මාස 06 කට අඩු කාලයක් සඳහා | රු:200.00 |
| 05 | බැනරයක් මගින් ප්‍රදර්ශනය කරනු ලබන තාවකාලික ප්‍රචාරක දැන්විමක් වෙනුවෙන් මාස 06 කට වැඩි එහෙත් මාස 12 කට අඩු කාලයක් සඳහා. | රු:250.00 |
| 06 | ඩිජිටල් දැන්වීම් පුවරු සඳහා ගාස්තු අය කිරීම.(වර්ග අඩියකට) | රු.300.00 |
| 07 | සභාව සතු ඩිජිටල් දැන්වීම් පුවරුවල දැන්වීම් ප්‍රචාරණය කිරීම. (වර්ග අඩියකට) | |

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී ජී.ජී.ධනුෂ්ක තිලකසිරි මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01. II 2026 වර්ෂය සඳහා මෝටර් වාහන නවතා තැබීම ගාස්තු අයකිරිමේ යෝජනාව ඉදිරිපත් කිරිම.**

<u>යෝජනාව</u>

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 148 වන වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන නවතා තැබීමේ ගාස්තුව 2026 වර්ෂය සඳහා වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පනවා අය කිරිම සුදුසු බවට යෝජනා කරමි.

මෝටර් වාහන නවතා තැබීමේ ගාස්තු- 2026 වර්ෂය

1) උප ලේඛනය

4(1) අතුරු ව්‍යවස්ථාව

| අනු අංක | | පළමුවැනි පැය රු:ශ | දෙවනි පැය රු:ශ | තෙවැනි පැය හා වැඩි වන සෑම පැයකටම රු:ශ |
|---|---|---|---|---|
| අ | මෝටර් සයිකලයක් සඳහා | 20.00 | 15.00 | 10.00 |
| ආ | මෝටර් කාර් රථයක් හෝ වෑන් රථයක් | 80.00 | 50.00 | 30.00 |
| ඇ | ත්‍රීරෝද රථයක් සඳහා. | 40.00 | 30.00 | 20.00 |
| ඈ | බස් රථයක්,මෝටර් කෝච් රථයක් ලොරියක් හෝ ට්‍රැක්ටරයක් සඳහා | 100.00 | 80.00 | 60.00 |

(11) උපලේඛනය
4(2) අතුරු ව්‍යවස්ථාව
රථ වාහන සඳහා වාර්ෂික අවසර පත්‍ර ගාස්තුව.

| | රු:ශත |
|---|---|
| (අ) ලොරි රථ /වෑන් රථ සඳහා | 3000.00 |
| (ආ) ත්‍රීරෝද රථයක් සඳහා | 2000.00 |
| (ඇ) මෝටර් බයිසිකලයක් සඳහා | 1000.00 |
| (ඈ) ලියාපදිංචි වීමේ මූලික ගාස්තුව | 1000.00 |
| (ඉ) විශේෂිත අවශ්‍යතා මත මෝටර් රථ නවතා තැබීමේ ගාස්තුව (මාසික) | 10000.00 |
| (ඊ) සභාව සතු රථගාල් තුල වල වාහන නවතා තැබීමේ ගාස්තුව | |
| I. මෝටර් රථ හා ත්‍රීවීල් | 1500.00 |
| II. මෝටර් බයිසිකල් | 1000.00 |

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ආර්.එම්. සරත් කුමාර රාජපක්ෂ මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01. III - 2026 වර්ෂය සදහා 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බලපත්‍ර නිකුත් කිරිමේ යෝජනාව.**

<u>යෝජනාව</u>

පාරිසරික පනතේ 26 වෙනි වගන්තිය යටතේ පැවරි ඇති බලතල ප්‍රකාරව මධ්‍යම පරිසර අධිකාරිය මගින් 2008 පෙබරවාරි මස 01 වෙනි දින සිට ක්‍රියාත්මක වන පරිදි වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ ආරම්භ කොට පවත්වාගෙන යනු ලබන අමුණා ඇති උප ලේඛනයේ (11) හි දැක්වෙන ක්‍රියාකාරකම් සම්බන්ධයෙන් ඉහත සඳහන් පනතේ සහ එකී සංශෝධන සහ ඒ යටතේ පනවන ලද රෙගුලාසි වලට අනුකූලව එකි ක්‍රියාකාරකම් පවත්වා ගෙන යනු ලබන්නන් විසින් 2023 ජනවාරි 01 වන දින සිට ක්‍රියාත්මක වන පරිදි ඉදිරි අවුරුදු 03 කට හෝ ඊට අඩු කාලයක් සඳහා බලපත්‍ර ගාස්තුව හා ඊට අදාළ වැට් බද්ද රු:500.00 ක උපරිමයකට යටත්ව අයදුම්පත්‍ර/ ලිපි ද්‍රව්‍ය ගාස්තුවක් හා ඊට අදාළ වැට් බද්ද හා එකී ක්‍රියාකරකම් වලට අදාළ වන මූලික ආයෝජනය මත පදනම් වූ උපලේඛන (1) හි සඳහන් පරික්ෂණ ගාස්තුවක් හා ඊට අදාළ වැට් බද්ද යන මුදල් මෙම ප්‍රාදේශිය සභාව වෙත ගෙවා පාරිසරික ආරක්ෂක බලපත්‍රයක් ලබාගත යුතු බවට 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ වගන්තිය ප්‍රකාර ලැබී ඇති බලතල අනුව වැලිමඩ ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

## 1980 අංක 47 දරණ ජාතික පාරිසරික පනත යටතේ බලපත්‍ර නිකුත් කිරීම -2026 වර්ෂය

<u>උපලේඛනය (1)</u>

<u>පරික්ෂණ ගාස්තු අයකිරිම</u>

| අනු අංකය | මූලික ආයෝජනය | ක්ෂෙත්‍ර පරීක්ෂණ ගාස්තු රු: ශත |
|---|---|---|
| 01 | රු:250,000.00 ට අඩු | 3000/=+ රජයේ අනුමත බදු |
| 02 | රු:250,001.00- 500,000.00/=දක්වා | 3750/= + රජයේ අනුමත බදු |
| 03 | රු:500,001.00 – 1,000,000.00/=දක්වා | 5000/= + රජයේ අනුමත බදු |
| 04 | රු:1,000,000.00 ට වැඩි | 10000/= + රජයේ අනුමත බදු |

## උප ලේඛනය (11)

(ඇ) කොටස

1. .සේවක සංඛ්‍යාව 10ක් හෝ ඊට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ඉටිපන්දම් නිෂ්පාදන කර්මාන්ත.
2. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින බතික් කර්මාන්ත.
3. සේවක සංඛ්‍යාව 5ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජ මට්ටමේ රෙදි සෝදන ස්ථාන(ලොන්ඩ්‍රි).
4. රෙදි වියන යන්ත්‍ර/මැෂින් 10ක් හෝ ඊට වැඩි සංඛ්‍යාවක් සහිත අත් යන්ත්‍ර පෙහෙකම්හල් හෝ ගෙතීමේ හෝ එම්බ්‍රොයිඩර් කිරිමේ කර්මාන්ත.
5. දිනකට ලීටර් 200කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ පොල්තෙල් නිස්සාරණය කිරිමේ කර්මාන්ත

6. පොල්තෙල් සහ ආයුර්වේද තෙල් නිස්සාරණය කිරිමේ කර්මාන්ත හැර දිනකට ලීටර් 10කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ ශාක තෙල් නිස්සාරණය කිරිමේ කර්මාන්ත
7. දිනකට 100කට අඩු නිෂ්පාදන ධාරිතාවක් සහිත මද්‍යසාරමය නොවන බීම වර්ග නිෂ්පාදනය කිරිමේ හෝ බෝතල්ගත කිරිමේ කර්මාන්ත.
8. දිනකට කිලෝග්‍රෑම් 500 හෝ ඊට වැඩි නිෂ්පාදන ධාරිතාවක් සහිත වියළි සැකසුම් ක්‍රියාවලි සහිත වී මෝල්.
9. මසකට කිලෝග්‍රෑම් 1000කට අඩු නිෂ්ෂාදන ධාරිතාවක් සහිත ඇඹරුම්හල්.
10. සේවක සංඛ්‍යාව10 හෝ ඊට වැඩි සහ 25ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දුම්කොළ වියළිමේ කර්මාන්ත හෝ දුම්වැටි හෝ දුම්කොළ ආශ්‍රිත වෙනත් නිෂ්පාදන කර්මාන්ත.
11. එක් තොගයකට කිලෝග්‍රෑම් 250 ක් හෝ ඊට වැඩි යෙදවුම් ධාරිතාවක් සහිත සල්ෆර් දුම් ගැසීම සහිත කුරුඳු දුම් ගැසීමේ කර්මාන්ත.
12. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාරයට ගන්නා ලුණු ඇසුරුම් කිරිමේ සහ සැකසුම් කිරිමේ කර්මාන්ත.
13. සේවක සංඛ්‍යාව 5ට වැඩි පිරිසක් සේවයේ නියුක්තව සිටින වාණිජමය තේ මිශ්‍ර කිරිමේ /මුහුවම් කිරිමේ කර්මාන්ත
14. සේවක සංඛ්‍යාව 5ට ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර නිෂ්පාදනය කිරිමේ හෝ සකස් කිරිමේ කර්මාන්ත
15. දිනකට පිටි කිලෝග්‍රෑම් 250ට අඩු ප්‍රමාණයක යෙදවුම් ධාරිතාවක් සහිත වාණිජ මට්ටමේ බේකරි සහ රස කැවිලි නිෂ්පාදන කර්මාන්ත.
16. ඕනෑම අවස්ථාවක වැඩුණු පක්ෂීන් 100 හෝ ඊට වැඩි සහ 500ට අඩු සංඛ්‍යාවක් සිටින කුකුළු ගණයේ පක්ෂි ගොවිපලවල්.
17. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 05 ක් හෝ ඊට වැඩි සහ10ට අඩු සංඛ්‍යාවක් සිටින ඌරු හෝ ගව ගොවිපලවල්.
18. ඕනෑම අවස්ථාවක වැඩුණු සතුන් 25 ක් හෝ ඊට වැඩි සහ50 ට අඩු සංඛ්‍යාවක් සිටින එළු ගොවිපලවල්.
19. වැඩුණු සතුන් මුළු එකතුව 100 ක් හෝ ඊට වැඩි සහ 500 ට අඩු සංඛ්‍යාවක් සිටින මිශ්‍ර ගොවිපලවක් * මිශ්‍ර ගොවිපලවල් සඳහා අනුපාතය=පක්ෂීන් සංඛ්‍යාව = (ඌරන් සංඛ්‍යාව+ගවයින් සංඛ්‍යාව)+10×(එළුවන් සංඛ්‍යාව)
20. ගබඩා ධාරිතාවය ඝන මීටර් 100 ක් හෝ ඊට වැඩි පළතුරු හෝ එළවළු හෝ මාංශ හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ගබඩා කරන ස්ථාන.
21. කොන්ක්‍රීට් පෙරසවි කර්මාන්ත
22. යන්ත්‍රානුසාරයෙන් සිමෙන්ති බ්ලොක් ගල් නිෂ්පාදනය කිරිමේ කර්මාන්ත.
23. දිනකට නිෂ්පාදන ධාරිතාවය මෙට්‍රික් ටොන් 20 ට අඩු ප්‍රමාණයක් සහිත හුණු පෝරණු.
24. සේවක සංඛ්‍යාව 5කට වැඩි ප්‍රමාණයක් සේවයේ නියුක්තව සිටින ප්ලාස්ටර් ඔෆ් පැරිස් අමුද්‍රව්‍ය වශයෙන් යොදාගන්නා ඕනෑම කර්මාන්තයක්
25. බෙලිකටු කැබලි කිරිමේ/පතුරු කිරිමේ කර්මාන්ත
26. උළු සහ ගඩොල් පෝරණු.
27. වීදුරු ද්‍රව කිරීමේ ක්‍රියාවලිය රහිතව වීදුරු භාණ්ඩ නිෂ්පාදනය කිරිමේ කර්මාන්ත.
28. කළු ගල් කැපීමේ සහ ඔප දැමීමේ කර්මාන්ත.
29. පුපුරණ ද්‍රව්‍ය භාවිතා කර එක් බෝර වලක් බැගින් පුපුරවමින් සිදු කරනු ලබන ශිල්පීය කැණීම් කටයුතු
30. දිනකට ඝන මීටර් 25 ට අඩු ඉතුරුම් ධාරිතාවක් සහිත ලී මෝල් හෝ සේවක සංඛ්‍යාව 05 හෝ ඊට වැඩි සහ 10 කට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින දැව ආශ්‍රිත කර්මාන්ත.
31. දැව පදම් කිරිම සඳහා බෝරෝන් පිරියම් ක්‍රමය භාවිතා කරන කර්මාන්ත.
32. බහු කාර්ය වඩු කාර්මික යන්ත්‍ර භාවිතා කරන වඩු කර්මාන්ත.
33. සේවක සංඛ්‍යාව 05 ක් හෝ ඊට වැඩි සහ 10ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින නේවාසික

පහසුකම් රහිත හෝටල් හෝ අවන්හල් හෝ උත්සව ශාලා හෝ සේවක 10ක් හෝ ඊට වැඩි සහ 20 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ආහාර පිළියෙල කිරිමේ ස්ථාන හෝ ආහාර සැපයීමේ සේවා.

34. පදිංචි සංඛ්‍යාව දිනකට 25ක් හෝ ඊට වැඩ සහ 100 ට අඩු පුද්ගලයන් ප්‍රමාණයක් සිටින නේවාසිකාගාර හෝ එවැනි ලැගුම්හල්.
35. විසිරි පින්තාරු කිරිම හෝ වාහන වායු සමීකරණ යන්ත්‍ර අලුත්වැඩියා කිරිම්,නඩත්තු කිරිම් හෝ සවි කිරිම් සිදු නොකරන වාහන අල්තුවැඩියා කිරිමේ හෝ නඩත්තු කිරිමේ කටයුතු සිදු කරන ගරාජ්.
36. වාහන සේවා සිදු නොකරන බහාලුම්(කන්ටේනර්) පර්යන්ත.
37. ඊයම් උණු කිරිම ඇතුළත් නොවන මුද්‍රණාල සහ අකුරු මුද්‍රණය කිරිමේ යන්ත්‍ර.
38. මෘත ශරිර කල් තබා ගැනීමට සකස් කිරිම සහිත මල් ශාලා.
39. මෙම උපලේඛණයේ "ඇ" කොටසේ ඇතුළත් නොවන එක් වැඩ මුරයකට සේවක සංඛ්‍යාව 10 හෝ ඊට වැඩි සහ 50 ට අඩු පිරිසක් සේවයේ නියුක්තව සිටින ඕනෑම ක්‍රියාකාරකමක් /කර්මාන්තයක්.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී එච්.එම්. කරුණාරත්න මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01. IV - 2026 වර්ෂය සඳහා විනෝද බදු අය කිරිමේ යෝජනාව ඉදිරිපත් කිරිම.**

**<u>යෝජනාව</u>**

ප්‍රසිද්ධ රග දැක්විමේ ආඥා පනත (176 අධිකාරය) 3 වැනි වගන්තිය යටතේ චිත්‍රපටි දර්ශනයක් , සැණකෙළියක්, මුදල් අයකරනු ලබන සෑම දර්ශනයක් සඳහාම මුද්‍රණය කරන ලද ප්‍රවේශ පත්‍ර වල වටිනාකමින් 15%ක් වු විනෝද බද්දක් වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍ර දේශය තුළ පනවා අය කිරිමටත්,1984 අංක 37 දරණ විනෝද බදු (සංශෝධන) පනතේ 16 වන වගන්තිය ප්‍රකාරව කටයුතු කිරිම සුදුසු බවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රීනි එච්.වී.එන් නිලුකා කුසුම් කුමාරි මැතිනිය** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර එ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01.V - පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ජල ගාස්තු පැනවීම.**

**<u>යෝජනාව.</u>**

1952 අංක 06 දරණ පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනතේ 2 වන වගන්තිය යටතේ පළාත් පාලන ඉදිකිරිම් අමාත්‍යතුමා විසින් සාදනු ලැබු 1988.08.23 දිනැති අංක 520/7 දරණ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික ජනරජයේ ගැසට් පත්‍රයේ IV(ආ) කොටසේ පල කරන ලද්දා වු පොදු අතුරු ව්‍යවස්ථාවල අංක 34 දරණ කාණ්ඩයේ වන ජල සම්පාදන යටතේ වු අංක 40 සිට 43 දක්වා වු අතුරු ව්‍යවස්ථා වල වු පරිදි පහත උපලේඛණයේ සදහන් අයුරු වැලිමඩ ප්‍රාදේශිය සභාව තුළ ඇති ජල සම්පාදන ක්‍රම වලින් 2026.01.01 සිට ජල ගාස්තු අය කිරිමට 1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 114 වගන්තිය ප්‍රකාර ලැබී ඇති බලතල අනුව වැලිමඩ ප්‍රාදේශිය සභාවට ගෙවිය යුතු බවට යෝජනා කරමි.

පළාත් පාලන ආයතන සම්මත අතුරු ව්‍යවස්ථා පනත යටතේ ජල ගාස්තු පැනවීම-2026

උප ලේඛණය

උල්පත් ජල යෝජනා ක්‍රම වෙනුවෙන්

| ඒකක ගණන | ස්ථාවර ගාස්තුව | ඒකකයක මුදල |
|---|---|---|
| 01-05 දක්වා | රු:300.00 | රු:30.00 |
| 06-10 දක්වා | රු:300.00 | රු:50.00 |
| 11-15 දක්වා | රු:300.00 | රු:70.00 |
| 16-20 දක්වා | රු:300.00 | රු:80.00 |
| 21-වැඩි වන සෑම ඒකකයක් සදහා | රු:300.00 | රු:100.00 |

පොම්ප ජල ක්‍රමය වෙනුවෙන්

| ඒකක ගණන | ස්ථාවර ගාස්තු | විදුලි බිල්පත් ගාස්තු | ඒකකයක මුදල |
|---|---|---|---|
| 01-05 දක්වා | රු: 300.00 | රු.200.00 | රු:30.00 |
| 06-10 දක්වා | රු: 300.00 | රු.200.00 | රු:50.00 |
| 11-15 දක්වා | රු: 300.00 | රු.200.00 | රු:70.00 |
| 16-20 දක්වා | රු: 300.00 | රු.200.00 | රු:80.00 |
| 21-වැඩි වන සෑම ඒකකයක් සදහා | රු: 300.00 | රු.200.00 | රු:100.00 |

1. 20 ට වැඩි වන සෑම ඒකකයක් වෙනුවෙන් රු: 100.00 ක් බැගින් විදුලි බිල්පත් ගාස්තුවක් අය කිරිම.
2. නව ජල සැපයුම් සදහා සම්බන්ධතා ගාස්තුව රු: 19500.00 අය කිරිම.
3. සභාව විසින් හිඟ ගාස්තු මත විසන්ධි කල ජල සැපයුම් නැවත ලබාදීමේ ගාස්තුව රු.5000.00
4. විසන්ධි කර නැවත ලබා දෙන (පාරිභෝගික ඉල්ලීම මත) ජල සම්බන්ධතා ගාස්තුව රු.2000.00
5. අයථා ජල පරිභෝජනය වෙනුවෙන් අය කරනු ලබන දඩ මුදල රු.10000.00

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රීනි ඩබ්.වාමලී තුෂාරිකා ප්‍රනාන්දු මැතිනිය** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකගතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01-VI - 2026 වර්ෂය සදහා අක්කර බදු පැනවීමට අදාළ යෝජනාව.**

**යෝජනාව.**

1987 අංක 15 දරන ප්‍රාදේශිය සභා පනතේ (3) වන උප වගන්තියෙන් ප්‍රාදේශිය සභාව වෙත පැවරි ඇති බලතල ප්‍රකාර , වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුල පිහිටියා වූද, ඉහත කී පනතේ 135වන වගන්තියේ නියමය යටතේ අක්කර බද්දෙන් නිදහස් කර නොමැත්තාවූද , ස්ථිර හෝ නිතිපතා ගොවිතැන් යටතේ වූ,

2026 වර්ෂය සදහා පනවන ලද අක්කර බද්ද මාර්තු 31, ජුනි 30, සැප්තැම්බර් 30, හා දෙසැම්බර් 31 යන දිනවලින් අවසන් වන සෑම කාර්තුවක් තුළදි සමාන වාරික හතරකින් ප්‍රාදේශිය සභා කාර්යාලයට ගෙවිය යුතු බව වැඩිදුරටත් නිවේදනය කරනු ලැබේ.2026 වර්ෂය සදහ වන සම්පූරණ අක්කර බද්ද 2026 ජනවාරි මස 31 වන දිනට පෙර ප්‍රාදේශිය සභා කාර්යාලය වෙත ගෙවනු ලැබුවහොත් එම සම්පූර්ණ අක්කර බදු ප්‍රමාණයෙන් සියයට දහය(10%)ක වට්ටමක්ද, එක් එක් කාර්තුවකට අදාළ අක්කර බද්ද ඒ එක් එක් කාර්තුවේ ප්‍රථම

මාසයේ අවසන් දිනයට මත්තෙන් ප්‍රාදේශිය සභාවට ගෙවනු ලැබුවහොත් සියයට පහ (5%) ක වට්ටමක්ද ගෙවීම සුදුසු බවට යෝජනා කරමි.

උපලේඛනය

| අනු අංකය | විස්තරය | ගාස්තු |
|---|---|---|
| 01 | ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 ට අඩු නමුත් හෙක්ටයාර් 01 ට නොඅඩුවන අවස්ථාවක. | රු:50.00 |
| 02 | ඉඩම් ප්‍රමාණය හෙක්ටයාර් 05 ක් හෝ ඊට වැඩිවන අවස්ථාවක | රු: 10.00 |

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රීනි ජේ.පි.චිත්‍රා ජයසිංහ පතිරණ මැතිනිය** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මමත විය.

**01-VII - 2026 වර්ෂය සඳහා වෙනත් සේවාවන් සඳහා ගාස්තු පැනවීමට අදාළ යෝජනාව.**

**යෝජනාව**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතෙන් හා වෙනත් අනුශාංගික අණපනත් වලින් සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර ව පහත දැක්වෙන උපලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වෙනත් සේවාවන් සඳහා අය කරගත යුතු ගාස්තු 2026 වර්ෂය සඳහා වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පනවා අය කිරිම සුදුසු බවට යෝජනා කරමි.

## වෙනත් සේවාවන් සඳහා ගාස්තු පැනවීම-2026

| | | |
|---|---|---|
| 01-ආදාහනයක් සඳහා අයකරනු ලබන ගාස්තු<br>01. එක් මෘත දේහයක් සඳහා අයකරන ලද ආදාහනාගාර ගාස්තුව (ඉන්ධන ගැලපුම් ගාස්තුව) | රු.14000.00 | |
| 02-ප්‍රාදේශිය සභාව සතු භූමි වෙන් කිරිම ( ක්‍රිඩා පිටි කැප්පෙටිපොළ/පළතුරු වත්ත/ගුරුතලාව ) ගාස්තු<br>I.පාසල් හා පෙර පාසල් ළමුන්ගේ ක්‍රිඩා කටයුතු හා උත්සව කටයුතු සඳහා<br>✓ ක්‍රිඩා උත්සව සඳහා ක්‍රිඩා පිටිය පමණක් (බල ප්‍ර දේශය තුළ)<br>✓ ක්‍රිඩා උත්සව සඳහා ක්‍රිඩා පිටිය පමණක් ( බල ප්‍ර දේශයෙන් පිටත)<br>✓ ආපසු ගෙවන ආරක්ෂිත ඇපතැන්පත් මුදල (බල ප්‍ර දේශය තුළ)<br>✓ ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පත් මුදල( බල ප්‍රදේශයෙන් පිටත) | රු.1000.00<br>රු.3000.00<br>රු.1500.00<br>රු.2000.00 | |
| II.රාජ්‍ය නොවන ආයතන හා පුද්ගලයින් සංවිධානය කරනු ලබන ක්‍රීඩා උත්සව.<br>✓ ක්‍රිඩා පිටිය පමණක් දිනකට (බල ප්‍රදේශය තුළ)<br>✓ ක්‍රීඩා පිටිය පමණක් (බල ප්‍රදේශයෙන් පිට)<br>✓ ආපසු ගෙවන ආරක්ෂිත ඇපතැන්පත් මුදල (බල ප්‍ර දේශය තුළ)<br>✓ ආපසු ගෙවන ආරක්ෂිත ඇප තැන්පත් මුදල( බල ප්‍රදේශයෙන් පිටත) | ක්‍රීඩාපිටි සඳහා<br>රු.5000.00<br>රු.6000.00<br>රු.4000.00<br>රු.5000.00 | |

| | | |
|---|---|---|
| III. රාජ්‍ය ආයතන සංවිධානය කරනු ලබන ක්‍රීඩාඋත්සව.<br><br>✓ ක්‍රීඩා පිටිය පමණක්<br>✓ ආපසු ගෙවන ඇප තැන්පතුව | <br><br>රු.1000.00<br>රු.3000.00 | |
| iv.දේශපාලන රැස්වීම් කටයුතු සඳහා (කැප්පෙටිපොළ/පළතුරු වත්ත/ගුරුතලාව/බොරලන්ද පොළ භූමිය/කොඩිගහ වේදිකාව/වැලිමඩ පොළ භූමිය/ඔරලෝසු කණුව අසල බස් නැවතුම/බොරලන්ද වේදිකාව)<br>✓ වැලිමඩ පොළ භූමිය<br>✓ කැප්පෙටිපොළ ක්‍රීඩාංගනය<br>✓ බොරලන්ද පොළ භූමිය<br>✓ ඔරලෝසු කණුව අසල<br>✓ පළතුරුවත්ත ක්‍රීඩාංගනය<br>✓ ගුරුතලාව ක්‍රීඩාංගනය<br>✓ කොඩිගහ වේදිකාව<br>✓ බොරලන්ද වේදිකාව<br>✓ ආපසු ගෙවන ඇප තැන්පත් මුදල(සියළුම භූමි සඳහා) | <br><br><br><br>රු.10000.00<br>රු.8000.00<br>රු.5000.00<br>රු.8000.00<br>රු.8000.00<br>රු.5000.00<br>රු.8000.00<br>රු.5000.00<br>රු.5000.00 | |
| v.වෙනත් වෙළඳ ව්‍යාපාර කටයුතු සඳහා දිනකට (කැප්පෙටිපොළ/පළතුරු වත්ත/ගුරුතලාව/බොරලන්ද පොළ භූමිය/කොඩිගහ වේදිකාව/වැලිමඩ පොළ භූමිය/ඔරලෝසු කණුව අසල බස් නැවතුම/බොරලන්ද වේදිකාව).<br><br>✓ ස්ථානය පමණක් (එක් දිනකට)<br>✓ ආපසු ගෙවන ඇප තැන්පතුව | <br><br><br><br>රු.7500.00<br>රු.5000.00 | |
| vi.සංගීත සංදර්ශන හෝ වෙනත් විනෝදාංශ පැවැත්වීම සඳහා (කැප්පෙටිපොළ/ගුරුතලාව/දඹවින්න/ වැලිමඩ පොළ භූමිය/ඔරලෝසු කණුව අසල බස්) නැවතුම/බොරලන්ද පොළ භූමිය).<br><br>✓ මුල් දින සඳහා ස්ථානය පමණතක් (ගාස්තු අය කරනු ලබන)<br>✓ ආපසු ගෙවන ඇප තැන්පතුව<br>✓ ගාස්තු අය නොකරන සංගිත සංදර්ශන හෝ වෙනත් විනෝදාංශ සඳහා<br>✓ වෙනත් - වෙළඳ කුටි (ප්‍රේක්ෂකාගාරය) දිනකට | <br><br><br><br>රු.10000.00<br><br>රු.10000.00<br>රු. 5000.00<br><br>රු. 5000.00 | 01 ට වැඩිවන සෑම දින සඳහා<br><br>රු.8000.00<br><br><br>රු.4000.00<br><br>රු.4000.00 |
| 03-ප්‍රවර්ධන වැඩසටහන් සඳහා ගාස්තු අය කිරිම.<br><br>1. මෝටර් බයිසිකල් විකිණිමේ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා<br>2. මෝටර් වාහන<br>✓ ප්‍රවර්ධන වැඩසටහන් සඳහා දිනකට.<br>✓ වෙනත් කුඩා ප්‍රමාණයේ වැඩසටහන් සඳහා දිනකට<br>✓ සිම්කාඩ්පත් සඳහා දිනකට | <u>පළමු දින</u><br><br>රු. 5000.00<br>රු10000.00<br>රු. 5000.00<br>රු. 2000.00<br>රු. 500.00 | <u>1-වැඩිවන සෑම දිනක් සඳහාම</u><br>රු.1500.00<br>රු.3000.00<br>රු.2000.00<br>රු.1000.00 |
| සංචාරක / ජංගම වෙළදාම් සඳහා අදාළ ගාස්තු අය කිරිම<br>මාළු වෙළදාම( දිනකට)<br>පළතුරු වෙළදාම ( දිනකට)<br>විදුලි උපකරණ ( දිනකට)<br>විසිතුරු භාණ්ඩ ( දිනකට)<br>මල් පැල අලෙවිය ( දිනකට)<br>බේකරි නිෂ්පාදන ජංගම අලෙවිය | <br>රු.1500.00<br>රු.1500.00<br>රු.1500.00<br>රු.1500.00<br>රු.1000.00<br>රු.1000.00 | |

| | | |
|---|---|---|
| 05-වැසිකිලි ද්‍රව්‍ය ඉවත් කර ගැනීම සඳහා ගලි රථය ලබා දීම වෙනුවෙන් ගාස්තු.<br>✓ එක් මුලික පැටවුමක් සඳහා සේවා ගාස්තු<br>✓ පරිපාලන වියදම්<br>✓ ප්‍රවාහන ගාස්තු (එක් කිලෝමීටරයකට)<br>✓ අමතර එක් පැටවුමක් සඳහා<br>✓ මළාපවහන පද්ධතියට එක් බැහැර කිරිමක් සඳහා | <br>රු. 6000.00<br>රු. 1700.00<br>රු. 400.00<br>රු. 5500.00<br>රු. 7500.00 | |
| | | |
| 06-මළාපවාහන ගාස්තු අය කිරිම.<br>✓ නව සම්බන්ධතා ගාස්තුව<br>✓ මාසික ගාස්තුව (පෞද්ගලික)<br>✓ මාසික ගාස්තුව (රාජ්‍ය)<br>✓ මැන්හෝල් පිරිසිදු කිරිම සඳහා (එක් වරකට)<br>✓ අනවසර සම්බන්ධතා ලබා ගැනීම වෙනුවෙන් දඩමුදල් | <br>රු.40000.00<br>රු. 2000.00<br>රු. 1000.00<br>රු. 2250.00<br>රු.50000.00 | |
| 07-වැලිමඩ සතිපොළෙහි කුඩ නිකුත් කිරිමේ ගාස්තු<br>✓ විශාල ප්‍රමාණයේ කුඩයක් සඳහා දිනකට<br>✓ මධ්‍යම ප්‍රමාණයේ කුඩයක් සඳහා දිනකට<br>✓ කුඩා ප්‍රමාණයේ කුඩයක් සඳහා දිනකට<br>✓ ප්‍රවාහනය සඳහා කුඩලබා දීමේදී ඇප මුදල (කුඩ 5 කට වඩා අවුරුද්දක ඇප තැන්පත් මුදල්) | <br>රු.30.00<br>රු.25.00<br>රු.20.00<br>රු.5000.00 | |
| 08-කොඩි කණු /කැනපි/පුටු කුලියට ලබා දීම.<br>✓ පාසල්,ආගමික ස්ථාන,රජයේ ආයතන සඳහා<br>• එක් කොඩි කණුවක් සඳහා (දිනකට)<br>• එක් කැනපියක් සඳහා (දිනකට)<br>• එක් පුටුවක් සඳහා දිනකට | අය කිරිමකින් තොරව<br>රු. 50.00<br>රු.1000.00<br>රු. 10.00 | |
| 09- තාවකාලික සෝගාතන බලපත්‍ර ගාස්තු<br>✓ සෝගාතක ගාස්තුව එක් සතෙකු ඝාතනය කිරිම සඳහා | <br>රු7500.00 | |
| 10-ජලය ලබා ගැනීම සඳහා මාර්ග පළුදු කිරිමේ ගාස්තු<br>✓ ගාස්තුව<br>✓ තැන්පතු මුදල | <br>රු.2500.00<br>රු.3000.00 | |
| 11- I.මාළු විකිණීමේ කඩ කාමරයක් සඳහා දෛනික ගාස්තුව<br>II.මාළු කඩකාමර වලින් නිකුත් කරන අපද්‍රව්‍ය ඉවත්කිරීමේ ගාස්තුව (එක් කඩකාමරයක් සඳහා දිනකට) | රු.1500.00<br>රු. 300.00 | |
| 12-පුස්තකාල සාමාජිකත්වය සඳහා ගාස්තු.<br>I. අයදුම්පත්‍ර ගාස්තුව<br>II. තැන්පත් මුදල<br>III. වර්ෂයක් පාසා සාමාජිකත්වය අලුත් කිරිම සඳහා<br>IV. පොත් ප්‍රමාද කිරිමේ ගාස්තුව ප්‍රමාද දිනකට<br>V. පුස්තකාලයේ සාමාජිකත්ව ගාස්තු පාසල් ළමුන් සඳහා<br>VI. පුස්තකාලයේ සාමාජිකත්ව ගාස්තුවැඩිහිටියන් සඳහා | <br>රු.100.00<br>රු.200.00<br>රු.100.00<br>රු. 5.00<br>රු.200.00<br>රු.300.00 | |
| 13-පෙර පාසල් ගාස්තු-:<br>✓ ඇතුළත් කිරිමේ ගාස්තුව<br>✓ මාසික ගාස්තුව<br>✓ අයදුම්පත්‍ර ගාස්තුව<br>• දිවා සුරුකුම් මධ්‍යස්ථාන ගාස්තු<br>✓ දිවා සුරුකුම් මධ්‍යස්ථානයට බඳවා ගන්නා අවුරුදු එකහාමරේ (1 1/2) සිට අවුරුදු 02 දක්වා දරුවන් සඳහා මාසික ගාස්තුව<br>✓ අවුරුදු 02 සිට 04 දක්වා දරුවන් සඳහා<br>✓ අවුරුදු 04 ටවැඩි දරුවන් සඳහා | <br>රු.1000.00<br>රු. 500.00<br>රු. 100.00<br><br>රු.5000.00<br>රු.3000.00<br>රු.2500.00 | |

| | | |
|---|---|---|
| ✓ අයදුම්පත්‍ර ගාස්තු | රු. 100.00 | |
| 14-ජල බවුසරය සේවයේ යෙදවීම .<br>✓ එක් ජල පැටවුමක් සදහා<br>✓ ප්‍රවාහන ගාස්තු කි:මී 01ක් සදහා | <br>රු3000.00<br>රු.400.00 | |
| 15-ප්‍රාදේශිය සභාවේ යන්ත්‍ර සේවයේ යෙදවීම හා සම්බන්ධ ගාස්තු.<br>1. X cavater යන්ත්‍ර පැයක් සදහා<br>2. බැකෝ ලෝඩර් යන්ත්‍රය සදහා (යන්ත්‍ර පැය එකක් සදහා)<br>3. ලොරි රථ සදහා (දිනකට /ඉන්ධන සහිතව) | <br>රු. 2500.00<br>රු. 6000.00<br>රු.18000.00 | |
| 16-පරිසර බලපත්‍ර අයදුම්පත් ගාස්තුව | රු.500.00 | |
| 17-වරිපනම් ලේඛණයේ හා බලපත්‍ර ලේඛණයේ උධෘතයක් ලබා ගැනිම සදහා (එක් වර්ෂයකට) | රු.300.00 | |
| 18-වැලිමඩ ප්‍රධාන කාර්යාලයට හා ප්‍රාදේශිය සභා උප කාර්යාල වලට අයත් කඩ සදහා පැවරුම් ගාස්තු.<br>✓ ඥාතීත්වය මත පැවරීමේදී කඩ පැවරුම් ගාස්තු (කලත්‍රයා හා දරුවන්)<br>✓ වැලිමඩ ප්‍රධාන කාර්යාලයට අයත් කඩ සදහා කඩ පැවරුම් ගාස්තු<br>✓ ප්‍රාදේශීය සභා උප කාර්යාල වලට අයත් කඩ සදහා පැවරුම් ගාස්තු<br>✓ පදික කඩකාමර සදහා කඩ පැවරුම් ගාස්තු<br>✓ පොළ කඩකාමර සදහා කඩ පැවරුම් ගාස්තු | <br><br>රු.25,000.00<br>රු.600,000.0<br>0<br>රු.500,000.0<br>0<br>රු.250,000.0<br>0<br>රු.300,000.0<br>0 | |
| 19-කොම්පෝස්ට් විකිණිම.<br>✓ කිලෝග්රෑම් 01 ක ඇසුරුම් කරන ලද මිල<br>✓ කිලෝග්රෑම් 01 ක ඇසුරුම් නොකරන ලද මිල | <br>රු. 15.00<br>රු. 12.00 | |
| 20-සුනඛ කරපටි ගාස්තුව (එක් කරපටියක් සදහා) | රු. 100.00 | |
| 21- I.දැව ප්‍රවාහනය කිරිමේ ගාස්තු (එක් දැව කඳක් සඳහා)<br>II. තැන්පතු ගාස්තුව (කඳන් 20ට වඩා වැඩිවන විට) | රු. 200.00<br>රු.50000.00 | |
| 22-ගොඩනැගිලි ඉදිකිරිම් හා ඉඩම් අනු බෙදුම් ගාස්තු.<br>✓ ගොඩනැගිලි අයදුම්පත්‍ර ගාස්තුව<br>✓ අනුකූලතා සහතික නිකුත් කිරිමේ ගාස්තුව<br>✓ ගොඩනැගිලි පරීක්ෂණ ගාස්තුව<br>වර්ග අඩි 1000 තෙක් ගාස්තුව<br>වර්ග අඩි 1001 – 1500 ගාස්තුව<br>වර්ග අඩි 1501 – 2000 ගාස්තුව<br>වර්ග අඩි 2001 සිට වැඩිවන සෑම වර්ග අඩි 1000කට හා ඉන් කොටසකට<br><br>✓ ඉඩම් කට්ටි කිරිමේ ගාස්තුව (එක් කට්ටියකට)<br>✓ ඉඩම් අනු බෙදුම් අයදුම්පත් ගාස්තුව<br>✓ NBRO අයදුම්පත් ගාස්තුව<br>✓ ගොඩනැගිලි අයදුම්පත්හී සංවර්ධන බලපත්‍ර කාලය දීර්ඝ කිරිමේ ගාස්තුව (වසරක කාලයක් සඳහා)<br>✓ දැනට ඉදිකර ඇති ගොඩනැඟිලි සැලසුම් අනුමත කර ගැනීම සඳහා දඩමුදල | <br>රු.1000.00<br>රු.2000.00<br><br>රු.1000.00<br>රු.2000.00<br>රු.3000.00<br>රු.1000.00<br><br>රු.500.00<br>රු.250.00<br>රු.250.00<br>රු.1000.00<br><br>රු.5000.00 | |
| 23- I. අනතුරුදායක ගස් සම්බන්ධ පෙරසැරි ගාස්තු<br>II. අනතුරුදායක ගස් සම්බන්ධ පෝරම ගාස්තු | රු.1000.00<br>රු. 250.00 | |
| 24- I. කසල ලබා ගැනිමේ ගාස්තු වරිපනම් බදු අය නොකෙරෙන එක් පරිශ්‍රයක් සඳහා මාසිකව<br>II. කසල ලබා ගැනිමේ ගාස්තු කියුබ් 01ක් සඳහා | රු. 300.00<br><br>රු.2000.00 | |
| 25- සන්නිවේදන කුළුණු/ඇන්ටනා කුළුණු/සම්ප්‍රේෂණ කුළුණු ඉදිකිරීමේ ගාස්තුව | රු.40000.00 | |
| 26- සභාව සතු දේපල සඳහා වන ගිවිසුම්පත් ගාස්තුව | රු. 250.00 | |

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ටී.කේ.ලලිත් පද්මසිරි මැතිතුමා** විසින් ස්ථිර කරන ලදී.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01.VIII - 2026 වර්ෂය සඳහා නිකුත් කරනු ලබන වෙළඳ බලපත්‍ර ගාස්තු පැනවීම.**

**යෝජනාව**

ප්‍රාදේශීය සභාව විසින් සාදන ලද අතුරු ව්‍යවස්ථාවක් යටතේ හෝ වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් පිළිගෙන ඇති සම්මත අතුරු ව්‍යවස්ථාවක් යටතේ වැලිමඩ ප්‍රාදේශීය සභාව විසින් 2026 වර්ෂය තුළදී නිකුත් කරනු ලබන බලපත්‍ර සම්බන්ධයෙන් 1987 දරන ප්‍රදේශීය සභා පනතේ 147 වන වගන්තිය සමග කියවිය යුතු 149 වන වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාර පහත උප ලේඛණයේ 1 වන තීරුවේ සඳහන් එක් එක් කර්මාන්තය වෙනුවෙන් , එම උප ලේඛණයේ 11 වන තීරුවේ අනුරූපිත සටහනෙහි මෙහි නිරූපිත ප්‍රමාණයක බලපත්‍ර ගාස්තුවක් පනවා අය කිරීමටත්,

එකී උප ලේඛණයේ සඳහන් කර්මාන්තය 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කර ඇත්තා වූ හෝ ඒ මණ්ඩලය විසින් අනුමත කරනු ලැබූ හෝ පිළිගනු ලැබ ඇත්තා වූද වන අවස්ථාවක , ඉහත 2 වන කොටසේ කුමක් සඳහන් ව තිබුණද, ඒ හෝටලය හෝ ආපන ශාලාව හෝ නවාතැන් පොල හෝ පවත්වාගෙන යනු ලබන ස්ථානය සඳහා සභාපතිවරයා විසින් නිකුත් කරනු ලබන බලපත්‍රයක් මත ගෙවිය යුතු ගාස්තුව ඒ හෝටලයේ හෝ ආපන ශාලාවේ හෝ නවාතැන් පොළෙහි හෝ 2026 වර්ෂය තුළ ලැබීම් වලින් සියයට එකක්(1%) වියයුතු බවත් යෝජනා කරමි.

1987 අංක 15 දරණ ප්‍රාදේශීය සභා පනතේ 147 වන වගන්තිය යටතේ පැනවෙන වෙළඳ බලපත්‍ර ගාස්තු

අතුරු ව්‍යවස්ථාව යටතේ පළමුවන උපලේඛනය-පීඩාකාරී ව්‍යාපාර

| | වෙළඳ ව්‍යාපාරයේ ස්වභාවය | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු; 750/= නොඉක්මවන අවස්ථාවක | ස්ථානයේ වාර්ෂික වටිනාකම රු:750/= ඉක්මවන එහෙත් 1500/= නොඉක්මවන අවස්ථාවක රු: ශත | ස්ථානයේ වාර්ෂික වටිනාකමරු:1500/= ඉක්මවන අවස්ථාවක රු: ශත |
|---|---|---|---|---|
| 01 | මිනිරන් ශුද්ධ කිරීම හෝ ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 02 | පොහොර හෝ රසායනික පොහොර නිපදවීම හෝ විකිණීමට තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 03 | සම් පදම් කිරීම | 500.00 | 750.00 | 1000.00 |
| 04 | සත්ත්ව පාලන(මස්,කිරිහෝ බිත්තර සඳහා) සතුන් ඇති කරන ස්ථාන පවත්වාගෙන යාම | 500.00 | 750.00 | 1000.00 |
| 05 | උම්බලකඩ නිෂ්පාදනය කිරීම හෝ කිලෝග්‍රෑම් 50 ට වඩා ගබඩා කිරීම | 500.00 | 750.00 | 1000.00 |

| | | | | |
|---|---|---|---|---|
| 06 | රබර් නිෂ්පාදනය කිරිම හෝ රබර් රොටී තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 07 | පශු වෛද්‍ය ගිලන් හලක් පැවැත්වීම. | 500.00 | 750.00 | 1000.00 |
| 08 | තොග වශයෙන් විකිණීම සඳහා නරක් වන සුළු කෑම වර්ග හෝ ආහාර ද්‍රව්‍ය තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 09 | සම් විකිණීමට තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 10 | කරවල මාළු හෝ ජාඩි කිලෝග්‍රෑම් 100ට වඩා වැඩි ප්‍රමාණයක් තබා ගැනීම. | 500.00 | 750.00 | 1000.00 |
| 11 | මාළු හෝ මස් ජාඩි දැමීම හෝ වේලීම හෝ අයිස් දැමීම. | 500.00 | 750.00 | 1000.00 |
| 12 | පොල් කටු අඟුරු හෝ දැව අඟුරු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 13 | දුම් කොළ වියළීම | 500.00 | 750.00 | 1000.00 |
| 14 | සත්ත්වආහාර නිපදවීම. | 500.00 | 750.00 | 1000.00 |
| 15 | පුන්නක්කු නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 16 | සත්ත්ව මාංශ හෝ ලේ පැසවීම | 500.00 | 750.00 | 1000.00 |
| 17 | සබන් නිෂ්පාදනය | 500.00 | 750.00 | 1000.00 |
| 18 | සත්ත්ව ඇට කටු ඇඹරීම හෝ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 19 | ට්‍රන්ක් පෙට්ටි සෑදීම | 500.00 | 750.00 | 1000.00 |
| 20 | අළුත් ලෝහ හෝ පරණ ලෝහ තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 21 | ලෝහ සුන්බුන් තබා ගැනීම | 500.00 | 750.00 | 1000.00 |
| 22 | ගෘහ භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
| 23 | වේවැල් භාණ්ඩ නිපදවීම | 500.00 | 750.00 | 1000.00 |
13. දැන්වීම් පුවරු සකස් කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම(ඩිජිටල් ප්‍රින්ටර්)
14. කළු ගල් තැනීම හෝ කැඩීම.
15. ගිණිකෙළි භාණ්ඩ හෝ රතිඤ්ඤා නිපදවීම

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ආර්.එම්.චන්ද්‍රසේකර මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**01. XI - 2026 වර්ෂය සඳහා වාහන හා සතුන් පිළිබඳ බදු අයකිරීමේ යෝජනාව ඉදිරිපත් කිරීම.**

**<u>යෝජනාව</u>**

1987 අංක 15 දරණ ප්‍රාදේශිය සභා පනතේ 148 වන වගන්තිය යටතේ පහත දැක්වෙන උප ලේඛනයේ සඳහන් අනුප්‍රමාණ අනුව වාහන හා සතුන් පිළිබඳ බද්දක් 2026 වර්ෂය සඳහා වැලිමඩ ප්‍රාදේශිය සභා බල ප්‍රදේශය තුළ පනවා අය කිරිමට යෝජනා කරමි.

# 2026 වර්ෂය සඳහා සතුන් පිළිබඳ බද්ද

| | |
|---|---|
| මෝටර් රථයක්,මෝටර් ට්‍රයිකාරයක්,මෝටර්ලොරියක්,මෝටර් බයිසිකලයක්,කරත්තයක්,ජින් රික්ෂොවක්,බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් නොවන සෑම වාහනයක් සඳහා | රු.25.00 |
| සෑම බයිසිකලයක් හෝ ට්‍රයිසිකලයක් හෝ බයිසිකල් කාරයක් හෝ කරත්තයක් සඳහා (අ) වෙළඳ කාර්ය සඳහා යොදවන්නේනම් | රු,18.00 |
| (ආ) වෙළඳ කාර්ය නොවන කාර්ය සඳහා යොදවන්නේ නම් | රු:4.00 |
| සෑම කරත්තයක් සඳහා | රු:20.00 |
| සෑම අත් කරත්තයක් සඳහා | රු:10.00 |
| සෑම රික්ෂෝවක් සඳහා | රු:7.50 |
| සෑම අශ්වයකු,පෝනියෙකු හෝ කොටළුවකු සඳහා | රු:15.00 |
| සෑම ඇතකු සඳහා | රු:50.00 |

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව ගරු මන්ත්‍රී එන්.එම්.කරුණාරත්න මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

යෝජනා අංක 02

**<u>වැලිමඩ නව වෙළඳ සංකීර්ණයේ අංක 30 දරණ කඩ කාමරය පැවරීම .</u>**

2025/08/13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 03 දරණ නිර්දේශය පරිදි වැලිමඩ වෙළඳ සංකීර්ණයේ අංක 30 දරණ කඩ කාමරය වැලිමඩ , බදුල්ල පාර,අංක 203 හි පදිංචි A.උපුල් ශාන්ත පෙරේරා මහතාට අදාල පැවරීම් ගාස්තු ලබාගෙන බදු අයිතිය පවරාදීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ආර්.එම්.දූෂාන්ත ඉන්දික රන්දෙනිය මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 03**

**<u>වැලිමඩ නව වෙළඳ සංකීර්ණයේ අංක 17 කඩ කාමරය පැවරීම</u>**

2025/08/13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 04 දරණ නිර්දේශය පරිදි වැලිමඩ වෙළඳ සංකීර්ණයේ අංක 17 දරණ කඩ කාමරය ලුණුවත්ත, ලංකා බැංකුව පාර,අංක 02හි පදිංචි ලක්සිරි වමින්ද රත්නායක මහතාට අදාල පැවරීම් ගාස්තු ලබාගෙන බදු අයිතිය පවරාදීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ඒ.එම්.හුසෙයින් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 04**

**<u>වැලිමඩ ප්‍රාදේශිය සභාව සතු බිම් අංක B-3, B-4, B-5 හා B-8 යන ඉඩම් කොටස්හි මාසික බිල් කිරිම අත්හිටුවීම</u>**

2025/08/13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 06 දරණ නිර්දේශය පරිදි මෙකි දේපල සඳහා පවරා ඇති නඩුවේ කටයුතු අවසන් වනතෙක් මාසික බිම් කුලි ලේඛණයේ ගාස්තු සටහන් කිරිම අත්හිටුවීම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් ෙමකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 05**

**<u>වැලිමඩ සති පොළ කඩ කාමර සඳහා තක්සේරු වටිනාකම අයකර ගැනීම හා ගිවිසුම්ගත වීම</u>**

2025/08/13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 09 දරණ නිර්දේශය පරිදි වැලිමඩ සති පොළ කඩ කාමර සඳහා _එකි බදුකරුවන් විසින් ගෙවිය යුතු තක්සේරු වටිනාකමින් 10% ක මුදලක් මුල් අවස්ථාවේ (ගිවිසුම්ගත වන අවස්ථාවේදි) අය කර ගැනිමටත්,ඉතිරි මුදල වසර 02 ක් තුළ (මාස 24 කින්) අය කර ගැනිමටත්, ඒ සඳහා ගරු ආණ්ඩුකාරතුමාගේ අනුමැතිය ලබා ගැනිමටත්, සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී එච්.එම්.කරුණාරත්න මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 06**

**<u>පදික කඩ කාමර සඳහා ගිවිසුම්ගත විම.</u>**

2025/08/13 දින පැවති මුදල් හා ප්‍රතිපත්ති කමිටුවේ අංක 10 දරණ නිර්දේශය පරිදි වැලිමඩ හේමපාල මුනිදාස මාවතේ ඉදිකර ඇති පදික කඩ සඳහා මාසික කුලිය අය කර ගැනීම හා ගිවිසුම්ගත විම සම්බන්ධව අදාළ කඩ බදුකරුවන් සමග පැවති සාකච්ඡාවේ දි ඔවුන් විසින් එකග වු පරිදි සකස් කරන ලද ගිවිසුම් කෙටුම්පත පරිදි ගිවිසුම ක්‍රියාත්මක කිරිමට සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී ආර්.එම්.මහේෂ් කෝසල රාජකරුණා විසින් ස්ථිර කරන ලදි.**

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, මෙම පදික කඩ කාමර ඉදිකර වෙළදුන් හට ලබා දෙන අවස්ථාවේ ගිවිසුම් අත්සන් කලා.නමුත් එම කඩ කිහිපයක් මේවන විට විකුණලා තියෙනවා.මේ නිසා ගිවිසුම අත්සන් කරන්නේ කවුරුන්ද යන්න පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අජිත් කුමාර මැතිතුමා**

මෙම පදික කඩ ලබා දෙන විට මුල් අවස්ථාවේ දි සැලකිය යුතු ප්‍රමාණයක් ගිවිසුම් අත්සන් කර නෑ.නමුත් මේවන විට එම කඩ විකුණලත් තියෙනවා. අප ලඟ ඇති ලේඛණය අනුව මුලින් කඩ ලබා දුන් වෙළදුන්ම තමයි මෙම ගිවිසුම අත්සන් කරන්නේ.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි අජිත් ප්‍රේමලාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි, පදික කඩ විකුණලා අලුතින් පදික කඩ හදාගෙන තියෙනවා.මේ නිසා මේ පිළිබඳ සොයා බලා ගිවිසුම් ගත වන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අජිත් කුමාර මැතිතුමා**

අජිත් මන්ත්‍රිතුමනි, මේ පිළිබඳ තොරතුරු තියෙනවා නම් අපට ලබා දෙන්න.නිති විරෝධිව වෙළදාම් සිදු වෙනවා නම් ඒ පිලිබඳව සොයා බලා ඉවත් කිරිමට අදාල මැදිහත් විම් සිදු කරනවා.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ හෙයින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි එම්.තාහිර් මහාරුෆ් මැතිතුමා පෙ.ව9.35 ට සභාවට පැමිණෙන ලදි.

**යෝජනා අංක 07**

**<u>2025 අගෝස්තු මස මන්ත්‍රී දීමනා ගෙවීම සම්බන්ධ ලිපිය</u>**

වැලිමඩ ප්‍රාදේශිය සභාවේ ගරු සභාපති,උප සභාපති හා ගරු මන්ත්‍රී තුමන්ලා , තුමියන්ලා 2025 අගෝස්තු මස දිමනා වශයෙන් රු.675,000.00 ක මුදලක් ප්‍රතිපූර්ණයට යටත්ව සභා අරමුදලින් දැරිමට සුදුසු බවට මෙම ගරු

සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී එනස්ට් ඩෙන්සිල් ස්ලේඩන් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 08**

**<u>2025 අගෝස්තු මස දෛනික වැටුප් ගෙවීම සම්බන්ධ ලිපිය</u>**

වැලිමඩ ප්‍රාදේශීය සභාවේ දෛනික සේවයේ නිරත සේවක මහත්ම මහත්මීන් 36 දෙනෙක් සඳහා 2025 අගෝස්තු මස දෛනික වැටුප් වශයෙන් රු.2,220,992.50 ක් සභා අරමුදලින් දැරීමට සුදුසු බවට මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු සභාපතිතුමා විසින් ගෙන එන ලද එම යෝජනාව **ගරු මන්ත්‍රී එස්.උදයකුමාර් මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 09**

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.එම්.එන්.කේ.කුමාරි මැතිනිය**

එච්.එම්.එන්.කේ.කුමාරි, ප්‍රාදේශීය සභා මන්ත්‍රී, බෝගහවත්ත,ගිරාඹේ,නුගතලාව,2025.08.18 සභා ලේකම්තුමා මඟින්,සභාපතිතුමා,ප්‍රාදේශීය සභාව,වැලිමඩ,

ගරු සභාපතිතුමනි,2025 අගෝස්තු මස මහ සභාවට ඉදිරිපත් කරනු ලබන කල් දී ඇති යෝජනාවයි. 48 – B ගිරාඹේ වසමේ සිරිපුර ගම්මානයට විදුලිය ලබා දී ඇත්තේ තනි අදියර විදුලි රැහැන් පද්ධතියකින් වන අතර ධාරිතාවය ප්‍රමාණවත් නොවීම හේතුවෙන් වසර ගණනාවක සිටම සිරිපුර ගම්මානයේ සහ දිවුරුම්ගම ගම්මානයේ විදුලි පාරිභෝගිකයින් දැඩි පිඩාවකට ලක්ව සිටියි.

මේ හේතුවෙන් මෙම ගම්මානවල පාසල් දරුවන්ගේ අධ්‍යාපන කටයුතු පවා අඩාල වී ඇති අතර සවස් කාලය වන විට ගෘහස්ථ විදුලි උපකරණ භාවිතා කිරිමටද හැකියාවක් නොමැත.එමෙන්ම නව ව්‍යාපාරයක් හෝ ආරම්භ කිරිමට බලාපොරෝතුවෙන් සිටින තරුණ ව්‍යවසයකයින්ට ද මෙම ගැටළුව දැඩිව බලපා ඇත.

උක්ත කරුණ සම්බන්ධයෙන් මීට පෙරද සියලුම ආයතන දැනුවත් කලද මේවන තෙක් කිසිදු විසඳුමක් නොලැබී ඇති හෙයින් නව ට්‍රාන්ස්ෆෝමරයක් සවි කර හෝ වෙනත් සුදුසු ක්‍රියාමාර්ගයක් ගෙන මෙම විදුලි පාරිභෝගික ගැටළුව කඩිනමින් විසඳා ගැනිම සඳහා අදාල වගකිව යුතු (ලංකා විදුලි බල මණ්ඩලය - ප්‍රාදේශීය කාර්යාලය දියතලාව හා ප්‍රධාන කාර්යාලය බදුල්ල) ආයතන දැනුවත් කළ යුතු බව මෙම ගරු සභාවට යෝජනා කරමි.මීට, විශ්වාසී, එච්.එම්.එන්.කේ.කුමාරි.

**ගරු ප්‍රාදේශීය සභා මන්තී ඉන්දික රන්දෙණිය** මැතිතුමා විසින් එම යෝජනාව ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීනි එච්.එම්.එන්.කේ.කුමාරි මැතිනිය**

ගරු සභාපතිතුමනි,මෙම යෝජනාව මා විසින් 2019 වර්ෂයේ දීත් සභාවට යෝජනා කරනු ලැබුවා. එවගේම කාලාන්තරයක් තිස්සේ සිරිපුර හා දිවුරුම්ගම ගම්මාන දෙකටම මෙම ගැටළුව බලපානවා.ගම් වැසියන්ට දෛනික කටයුතු කර ගැනිමට ලැබෙන විදුලි ධාරිතාව ප්‍රමානවත් නෑ.මේ පිළිබඳව අදාල ආයතන වෙත අත්සන් ලේඛණ සහිතව මා ඉදිරිපත් කරලා තියෙනවා.එවගේම ගම් වැසියන් විසින් ද අදාල ආයතන දැනුවත් කරලා තියෙන අතර තවද පසුගිය ප්‍රාදේශිය සම්බන්ධිකරණ කමිටුවටද යෝජනාවක් ලෙස මා ඉදිරිපත් කරනු ලැබුවා. ඒ තුළින් මේවන විට ක්‍රියාමාර්ග ගැනිමට කටයුතු කරනවා ඇතැයි මා සිතනවා.එසේම ගම් වැසියන්ට නව ව්‍යාපාර , නව ආදායම් උත්පාදන කටයුතු කර ගැනිමට නොහැකි තත්වයක් මෙම තත්වය තුල ඇති වෙලා තියෙනවා.මේ හේතුවෙන් සභාව පැත්තෙන් අදාල ආයතන දැනුවත් කර ඉදිරි කටයුතු කරන ලෙස මා යෝජනා කරනවා.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 10**

චන්ද්‍රිකා තෙන්නකෝන්,ප්‍රදේශිය සභා මන්ත්‍රී ,වැලිඅරාව,වංගිය කුඹුර,බොරලන්ද,2025.08.04,සභා ලේකම් මඟින්,ගරු සභාපතිතුමා,ප්‍රාදේශිය සභාව,වැලිමඩ, ගරු සභාපතිතුමනි,ඕලුගම ගම්මානයේ පිහිටි ප්‍රජා ශාලාව සභාවට පවරා ගැනිම සම්බන්ධවයි.ඕලුගම ප්‍රජා ශාලාව හා එයට අයත් ඉඩම (පර්චස් 40) ප්‍රාදේශිය සභාවට පවරාගෙන ශාලාව අළුත්වැඩියා කර ව්‍යාපෘතියක් ආරම්භ කිරිම වෙනුවෙන් නිවාස සංවර්ධන අධිකාරිය සතුව පවතින මේ බිම් කොටස සභාවට පවරා ගැනිමට මහා සභාවට යෝජනා කරමි.ස්තූතියි.විශ්වාසි ,චන්ද්‍රිකා තෙන්නකෝන්.

එම යෝජනාව **ගරු මන්ත්‍රී එල්.ඒ.ප්‍රියන්ත චාමින්ද මැතිතුමා** විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රීනි චන්ද්‍රිකා තෙන්නකෝන් මැතිනිය**

ගරු සභාපතිතුමනි. මෙම බිම් කොටස ගරු රණසිංහ ප්‍රේමදාස මැතිතුමාගේ ඉදි කිරිමක් ලෙස ඕලුගම ගම් උදාන භූමියත් සමග ගමට දායාද වුවකි.එතැන් සිට මේ දක්වා යෞවන සමාජයත්,.හෙළ හවුල ලෙස ආරම්භ කල යෞවන සමාජයත්,සිහිති හවුල ලෙස ආරම්භ කළ සිහිති ළමා සමාජයත් , ඉන්පසුව සණස ළමා සමාජයත් මෙම ප්‍රජා ශාලාවේ පැවතුනි .පසුව පෙර පාසලක් ආරම්භ කරනවා.මෙහි කාමර 03 කින් සමන්විත ගොඩනැගිල්ලක් තියෙන අතර ඒ තුළ විවිධ සමාජ සේවාවන් වැඩසටහන් ක්‍රියාත්මක කරනු ලැබුවා.නමුත් අදවන විට නිසි නඩත්තුවක් නොමැති නිසා වහල දිරාපත් වෙලා තියෙනවා.එබැවින් වර්ෂාව කාලයට වැසි ජලය ගොඩනැගිල්ලට කාන්දු වි ගොඩනැගිල්ල දිරාපත්විමට ලක් වෙලා තියෙනවා.ඒ නිසා ගම්මානයේ අභිවෘද්ධිය උදෙසා කටයුතු කිරිමට නම් මෙම බිම් කොටස සභාවට පවරා ගන්න ඕනි .මිට අදාල ඉදිරි පියවර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රභාත් රවීන්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පසුගිය සභාවන්හිද මෙම යෝජනාව ගෙන එනු ලැබුවා.නමුත් එම ගෙන එනු ලබන යෝජනා වන්හි මේ වනතෙක් ප්‍රගතියක් අපට දක්නට ලැබෙන්නේ නෑ.මෙලෙස ගෙන එනු ලබන යෝජනා ක්‍රියාත්මක නොවන්නේ කුමක් හෝ ගැටළුවත් නිසාදැයි සොයා බලා ඒ පිළිබඳව සභාව දැනුවත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මෙම යෝජනාව සම්මත වුවාට පසුව අදාල මැදිහත්විම් කර සභාව දැනුවත් කිරිම් කටයුතු කරන බවට **ගරු**

**සභාපතිතුමන්** විසින් පවසන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 11**

**ගරු ප්‍රාදේශිය සභා එම්.එච්.එම්.හාසිම් මැතිතුමා**

එම්.එච්.එම්.හාසිම් ,ප්‍රාදේශිය සභා මන්ත්‍රි,වැලිමඩ,සභාපති,ප්‍රාදේශිය සභාව,වැලිමඩ,

ප්‍රාදේශිය සභා මන්ත්‍රි හැඳුනුම්පතක් ලබා ගැනිම සම්බන්ධවයි.ගරු මහත්මයානෙනි,ඉහත නම් සඳහන් එම්.එච්.එම්.හාසිම් වන මා දැනට වැලිමඩ ප්‍රාදේශිය සභාවේ මන්ත්‍රි කෙනෙක් වශයෙන් කටයුතු කර සිටිමි.

කෙසේ නමුත් දැනට සභාව නියෝජනය කරන සියළු මන්ත්‍රිවරුන්ගේ අනන්‍යතාවය තහවුරු කිරිමට නොහැකිවීමෙන් රාජ්‍ය හා පුද්ගලික ආයතනවලදී යම් යම් සේවවාන් ලබා ගැනිමේ දි දැඩි අපහසුතාවයකට පත්වනු ඇත.මෙම අපහසුතාවය වලක්වාලීම සඳහා සියළු මන්ත්‍රිවරුන්හට මන්ත්‍රි හැඳුනුම්පත ඉතා ඉක්මණින් ලබා දිමට කටයුතු කර දෙන ලෙසට ඉතා කාරුණිකව ඉල්ලා සිටිමි. තවද මෙය අගය කොට සලකමි. විශ්වාසි. එම්.එච්.එම්.හාසිම්

එම යෝජනාව ගරු මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි අජිත් ප්‍රේමලාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පෙර තිබූ සාමදාන විනිසුරු තනතුර තවමත් නිත්‍යානුකූලව බල පැවැත්වෙනවාද නැත්නම් එය අහෝසි වනවාද යන්න පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

මන්ත්‍රී ධුරය අහෝසි වනවාවත් සමගම සාමදාන විනිසුරු තනතුර අහෝසි වන බව **ගරු සභාපතිතුමා** විසින් පවසන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**යෝජනා අංක 12**

ප්‍රාදේශිය සභා මන්ත්‍රී , එම්.ඇම්.කරුණාරත්න, 2025.08.18, ගරු ප්‍රාදේශිය සභා ලේකම්තුමා,ප්‍රාදේශිය සභාව,වැලිමඩ,ඉදිරි මාසික සභාවාරය සඳහා ඉදිරිපත් කරන යෝජනාවයි.

අප ප්‍රාදේශිය සභාව සතු වැලිමඩ පොල භූමිය කාලීන වශයෙන් සංවර්ධනය කර එහි ප්‍රතිලාභ ප්‍රදේශයේ ජනතාවට අත්කර දිම සඳහා පසුගිය ප්‍රාදේශිය සභා කාලය තුල ආරම්භයක් ලබාගත් නමුත්,මේවන තෙක් එහි හොඳම ප්‍රතිඵලය අත්කර ගැනිමට ප්‍රාදේශිය සභාව ලෙස අප අසමත්ව ඇත. මෙම පොළ භූමිය තුළ ඇති අඩුපාඩු හා ක්‍රියාවලිය හඳුනාගෙන විධිමත් ක්‍රියාවලියකට විධිමත් ලෙස යොමු කරලීම සඳහා මේවන විට අප ප්‍රාදේශිය සභාව ලෙස විශේෂ අවධානයක් යොමු කර සිදු කරමින් ඇති කතිකාව හා උත්සහය අගයන අතර මෙම උත්සහයට සමගාමීව අප පොල භූමියේ ඵලදායි ඉදිරි පැවැත්මට අත්‍යාවශ්‍ය ව්‍යාපාරික සේවාවන් වන දැනට පොළ භූමියේ ඉහත මාලයේ අංක 01- 02 හි පවත්වාගෙන යන ආපන ශාලා දෙක මේවන විට සුදුසු හොඳම ලෙස ප්‍රතිපලයක් ලබා ගැනිමට නොහැකිව වසා ඇති පොල භූමියේ පහත මාලයේ අංක F 01 - 05 දරණ කඩ කාර 05 ආපන ශාලාවකට සුදුසු ලෙස ප්‍රතිසංස්කරණය කර ඉදි කිරිමට ලක්කර විධිමත් ටෙන්ඩර් කැඳවිමකින් ව්‍යාපාර කටයුතු සඳහා ලබා දිමට කටයුතු කිරිම කාලීන වශයෙන් සුදුසු බවට මෙම ගරු සභාවට

මා යෝජනා කර සිටින අතර , මේ සමගම ඉහළ මාලයේ අංක 01-02 කඩ කාමරවලටද සුදුසු ව්‍යාපාරික අවස්ථාවක් ලබා දිමට අවදානය යොමු කරන ලෙසද මෙම ගරු සභාවට මා යෝජනා කර සිටිමි.ස්තුතියි,මෙයට , ප්‍රාදේශිය සභා මන්ත්‍රී එම්.ඇම්.කරුණාරත්න.

එම යෝජනාව ගරු **මන්ත්‍රිනි චාමලි තුෂාරිකා මැතිනිය** විසින් ස්ථිර කරන ලදි.

**ප්‍රාදේශිය සභා මන්ත්‍රී , එම්.ඇම්.කරුණාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි, නාගරික සංවර්ධන අධිකාරියේ මැදිහත්විමෙන් 2018 වර්ෂයේදි ආරම්භ කරන ලද වැලිමඩ පොල භූමිය වැලිමඩ ප්‍රදේශයේ ජනතාවට ලැබුණු දැවන්තම ප්‍රතිලාභයක් වෙනවා.නමුත් සභාවත් ලෙස මෙ සදහා සැලකිය යුතු කාලයක් ගත වි ඇතත් හොදම ප්‍රතිලාභ,ප්‍රතිඵල ප්‍රදේශයේ ජනතාවට හා වෙළඳ ප්‍රජාවට අත්පත් කරදිමට අවස්ථාවක් නොලැබ කල්ගත වෙමින් තියෙනවා.වර්තමාන ප්‍රාදේශිය සභාව මේ ගෙවුනු කාලය තුල මේ සම්බන්ධයෙන් අවධානය යොමු කරමින් පොළ භූමිය තුල පවතින අවිධිමත් තත්වයන් තියෙනවා නම් ඒවා හදුනා ගෙන විධිමත් කිරිමට උත්සහයන් ගන්නවා.මේ සම්බන්ධයෙන් පසුගිය මුදල් කමිටුවේ දිද සාකච්ඡා කලා.

මේ නිසා වැලිමඩ පොල භූමිය විධිමත් ක්‍රියාකාරි වැඩ පිලිවෙලකට යොමු කිරිමේදි විශේෂයෙන්ම මාළු කඩ පවත්වාගෙන යාම සදහා සාදා ඇති ස්ථානය මේවන විට ප්‍රයෝජනයට ගැනිමට නොහැකි , ලාබ ලබා ගැනිමට නොහැකි නිසා මගේ පැත්තෙන් මා යෝජනා කරන්නේ මේ වසා ඇති මාළු කඩ විශේෂයෙන් පොලට සම්බන්ධවන පාරිභෝගිකයින්හට,ප්‍රදේශයේ ජනතාවට වගේම ව්‍යාපාරික ප්‍රජාවට වඩාත් පහසු සේවාවක් වගේම අත්‍යවශ්‍ය සේවාවක් වන ආපන ශාලාවක් විවෘත කර ටෙන්ඩර් මගින් මේ සදහා අවස්වාව ලබා දිම සුසුදු බවට මා යෝජනා කරනවා.තවද වැලිමඩ සංවර්ධනය කිරිමේ දි වැලිමඩ පොල භූමිය අත්‍යවශ්‍ය තිරණාත්මක සාධකයක් ලෙස මා හිතනවා.එවගේම මේ සම්බන්ධයෙන් ඔබතුමාගේ හා ගරු මන්ත්‍රි මණ්ඩලයේ අදහස් ඉදිරිපත් කරමින් මෙම යෝජනාව සම්බන්ධයෙන් ගත යුතු , ගත හැකි මැදිහත්විම ලබා ගැනිමට කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි අජිත් ප්‍රේමලාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,පොල භූමියේ පවතින වෙළදාම් අනුව ආපනශාලා කරගෙන යාමට නොහැකි තත්වයක් උදාවෙලා තියෙනවා.පිටස්තර වෙළදාම් කරන අය කෑම ගෙනවිත් විකුණනවා.මේ නිසා ආපනශාලා සම්බන්ධයෙන් ප්‍රාදේශිය සභාව මැදිහත් වි කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි ඉන්දික සම්පත් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මෙම යෝජනාව ගෙන එම සම්බන්ධයෙන් කරුණාරත්න මැතිතුමාට මා ස්තුතිවන්ත වෙනවා.පොළ භූමිය ඉදි කිරිම් පිළිබදව අපි ඒ කාලයේදි සාකච්ඡා කිහිපයක්ම පැවැත්වූවා.එහිදි වෙළඳ සංගමය හා මන්ත්‍රවරු විසින් පොලේ කඩ කාමර හා ආපන ශාලා ඉදි කිරිම පිළිබදව සාකච්ඡා කළා.මෙහිදි අපේ අදහස වූයේ පොල කොටස සම්පූර්ණයෙන්ම පාර මට්ටමට පහත් කිරිමටත්,පොළ ඉදිකර ඊට උඩින් කඩ කාමර ඉදි කිරිමටත්ය.මේ සදහා නාගරික සංවර්ධන අධිකාරිය මගින් සම්පූර්ණ වියදම් දැරිම සිදු කරිමට සුදිනම්ව සිටියා. එවගේම ආපනශාලා පොළ භූමියේ පහළ කොටසට වන්නට ඉදි කළ යුතු බවට සභාවට දෙතුන් පාරක්ම අප යෝජනා ඉදිරිපත් කළා. නමුත් ඒකාධිපතිව මෙම පොලේ ඉදි කිරිම් කටයුතු සිදු කරනු ලැබුවා.කෙහොම වුනත් දැන් එය වෙනස් කිරිමට හැකියාවක් නෑ. එසේම පොල භූමිය ව්‍යාපාරික කටයුතු සදහා බෙදා දිමේදිත් ඒකාධිපතිත්වයකින් කටයුතු කරනු බව දක්නට ලැබුනා.

තවද , පොල භූමියේ ඉදිරිපිට වාහන නවතා වෙළදාම් කටයුතු සිදු කරනවා.මෙ නිසා පොළ භූමියට එන පාරිභෝගිකයින් මහත් අපහසුතාවයකට පත්වෙනවා.මේ පිළිබඳව සොයා බලා අවශ්‍ය ඉදිරි පියවර ගන්නා ලෙස මා ඉල්ලා සිටිනවා .

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර ඒ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

**06.ගරු සභාපතිතුමා විසින් ලෙන එන හදිසි යෝජනා**

**යෝජනා අංක 01.**

ඕලු ගංතොට ග්‍රාමීය ආයුර්වේද රෝහල පිහිටි ඉඩමේ මායිම් ලකුණු කිරිම සම්බන්ධවයි.

01.මෙම භූමිය මීට පෙර, පාසලක ක්‍රිඩා පිටියක් සහිතව පිහිටි අතර ,පසුව මෙම ඉඩම් කොටසේ ඕලු ගංතොට ග්‍රාමීය රෝහල අලුතින් ආරම්භ කර ඇත.

02.ඒ අනුව,එම ක්‍රිඩා පිටිය සහිත ඉඩම කොටසක් ආයුර්වේද රෝහලටත් ඉතිරි කොටස ක්‍රිඩා පිට්ටනියක් සඳහා ප්‍රාදේශිය සභාවට පැවරිමටත් යෝජනා වි ඇති අතර ,එම ඉඩම මැණුම් කටයුතු සභාවේ වියදමින් දැරිමටත්, මැනුම් කටයුතු සඳහා මිනින්දොරු දෙපාර්තමේන්තුවට යොමු කිරිමට ද තීරණය වි ඇත.

03.ඒ අනුව , එම ඉඩම මැනුම් කටයුතු සිදු කිරිමට අදාල වියදම් සහා අරමුදලින් දැරිමට අවශා අනුමැතිය සඳහා ගරු සභවට කාරුණිකව ඉදිරිපත් කරමි.

එම යෝජනාව ගරු මන්ත්‍රී චාමර ප්‍රසාද් මැතිතුමා විසින් ස්ථිර කරන ලදි.

මෙම යෝජනාව පිළිබඳව සභාවේ එකඟතාවය විමසන ලද අතර එ සඳහා විරෝධතා මතු නොවූ බැවින් මෙකී යෝජනාව 2025.08.28 දින සභාවේදී ඒකමතිකව සභා සම්මත විය.

07.කාරක සභා වාර්තා සලකා බැලිම.

ගරු ප්‍රාදේශිය සභා සභාපති ඩි.එම්.අජිත් කුමාර මැතිතුමා

සංශෝධන ඇත්නම් ඉදිරිපත් කරන ලෙස පවසා සිටින ලදි.

ඒ අනුව,

I. 2025.08.13 වන දින මුදල් කමිටු වාර්තාව
II. 2025.08.05 වන දින පරිසර හා සේවා කමිටු වාර්තාව
III. 2025.08.06 වන දින නිවාස හා ප්‍රජා සංවර්ධන කමිටු වාර්තාව
IV. 2025.08.07 වන දින කාර්මික හා සේවා කමිටු වාර්තාව
V. 2025.07.08 වන දින මුදල් හා ප්‍රතිපත්ති කමිටුවෙහි ප්‍රගතිය

ඉහත සඳහන් කාරණ සහා වාර්තා සලකා බලන ලද අතර එකී නිර්දේශයන් ක්‍රියාත්මක කිරීමට සභාව අනුමත කරන ලදි

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රි අජිත් ප්‍රේමලාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි.2025.08.05 වන දින පැවති පරිසර හා සේවා කමිටු වාර්තාවේ තුන් වන පිටුවේ 2025.08.13 වන දින මලාපවහන පද්ධතිය පිරිසිදු කිරිම් කටයුතු සිදු කරන බව සඳහන් කරලා තියෙනවා.නමුත් මෙහි දි එම කාර්ය සිදු කර තිබුනත් නිසි ආකාරව සිදු කර නැත.එහි දි වෙළද සංකිර්ණය අසල අළුත් වැඩියා කිරීමට මාර්ගය පළුදු කර තිබුණත් එය නැවත සකස් කර නොමැත.එවගේම කොන්ක්‍රිට් ප්ලේට් ඉවත් කර පිරිසිදු කිරිම් කටයුතු සිදු කර ඇති අතර ඒවා නිසි පරිදි පිලිවෙලට නැවත සකස් කර නැත.මේ නිසා ඒ තුළින් අනතුරු

සිදු විය හැකි අතර මේ පිලිබඳව සොයා බලා කටයුතු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු සභාපති අජිත් කුමාර මැතිතුමා**

මලාපවහන පද්ධතිය පිරිසුදු කිරිම කටයුතු කරිම මේවන විට ඒ සදහා අවශ්‍ය ප්‍රතිපාදන මුදල් කමිටුවේ අංක 21 මඟින් වෙන් කරලා තියෙනවා.එවගේම කේන්ක්‍රිට් ප්ලේට් සකස් කිරිම මාර්ග සංවර්ධන අධිකාරිය සමග මේ වන විට සාකච්ජා කරලා තිබෙන අතර ඉදිරියේදී හැකි ඉක්මනින් එම ගැටළු විසදිමට කටයුතු කරනවා.

**08. ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තා හා සභාගත කළ යුතු වෙනත් ලේඛණ**

ලැබිම් හා වියදම් පිළිබඳ 2025 ජුලි මස මාසික ප්‍රකාශන එකතු කළ ආදායම් පිළිබඳ ප්‍රගති වාර්තාව ගරු සභාව විසින් පිළිගන්නා ලදි.

**ගරු සභාපති අජිත් කුමාර මැතිතුමා**

ආපදා කළමනාකරණ අමාත්‍යාංශය මැදිහත් විමෙන් සභාවට ලොකු අඩුපාඩුවක්ව පැවති ජල බවුසරයක් මේවන විට ලැබිලා තියෙනවා.මේ සදහා ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලය විශාල කැප කිරිමක් සිදු කරනු ලැබු අතර ඔවුන්ට මාගේ ස්තුතිය පුද කර සිටිනවා. මෙම ජල බවුසරය 9500L ක ධාරිතාවයනින් යුතු වන අතර මේ සදහා ගාස්තු අය කිරිම පිළිබදවත් අපි තිරණයක් ගෙන තියෙනවා.ඒ අනුව 3000 l ට්‍රැක්ටර් බවුසරය සඳහා රු.3000.00ක සැපයුම් ගාස්තුවක් අය කරන නිසා මේ සදහාද රු.9000.00 ක ගාස්තුවත් අය කිරිමට තීරණය කර ඇත.එසේම ප්‍රාදේශිය තුළ ඇති ජල ගැටළුවට අදාල මැදිහත් විම් අපට සිදු කිරිමට දැන් හැකියාව පවතිනවා.

**09.ගරු මන්ත්‍රිවරුන්ගේ අදහස්**

පහත සදහන් මන්ත්‍රිවරු විසින් ඔවුන්ගේ අදහස් හා යෝජනා ඉදිරිපත් කරන ලදි.

**ගරු ප්‍රාදේශිය සභා තාහිර් මහාරුෆ් මැතිතුමා**

ගරු සභාපතිතතුමනි,වැලිමඩ නගරයේ වරිපනම් හා තක්සෙරු කිරිම වැඩි කිරිම සම්බන්ධයෙන් ව්‍යාපාරිකයින්ගේ අත්සන් සහිතව මා යෝජනාවක් ඉදිරිපත් කරනවා.සියලු ව්‍යාපාරයන්ට වැඩි තක්සෙරුවක් ඉදිරිපත් කර තිබෙන අතර එය අඩු කිරිමට සංශෝධනයක් ඉදිරිපත් කල යුතු බව මාගේ යෝජනාවයි.මේ පිළිබදව වෙළඳ සංගමය ඔබතුමා සමග අවස්ථා කිහිපයකදිම සාකච්ඡා කලා.එසේම ගරු ආණ්ඩුකාරතුමා සමගත් සාකච්ඡා කලා.කෙසේ නමුත් මේ පිළිබදව අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා. ප්‍රාදේශිය සභා ක්‍රියාවලිය හා කාර්යභාරය යටතේ වරිපනම් සම්බන්ධව 10 වන වගන්තියේ ඇ,ඉ ,උ ඒ උප වගන්ති තුළින්ද මේ පිළිබදව කරුණු සදහන් කර ඇත.මේ පිළිබදව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

එමෙන් ම වැලිමඩ නගරයේ ආයුර්වේද වෙළඳ ස්ථානයක නීති විරෝධී මත් ද්‍රව්‍ය විකුණන බවට තොරතුරු ලැබි තියෙනවා.මේ නිසා තරුණ පරපුර නොමග යාමට ඇති ඉඩ කඩ වැඩිය.ඒ නිසා මේ පිළිබදවත්

ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද ගිය සභා වාරයේ දි මා නගරයේ වාහන තදබදය අවම කිරිම සම්බන්ධව යෝජනා ඉදිරිපත් කලත් මෙවන විටත් ඒ සඳහා ස්ථිර විසඳුම් ලබා දි නොමැත.එසේම ත්‍රිරෝද රථ ගාල් කරන ප්‍රමාණය දක්වන දැන්වීම් පුවරු තවම සවිකර නැති අතර ත්‍රිවිල් රථ ගාල් කිරිම කෙළින් අතට සිදු නොකර හරස් අතට ගාල් කිරිම සිදු කරන්නේ නම් එයින් වැඩි ඉඩ ප්‍රමාණයක් ලබා ගත හැක.ඒ තුළින් පාරිභෝගිකයින් වාහන ගතර කිරිමට ඉඩ ප්‍රස්ථාව සලසා ගත හැකිය. එමෙන්ම වාහන තදබදය අඩු කිරිමට වැලිමඩ නගරය මැදින් මගී පාලමක් ඉදි කිරිම සුදුසු බවට මා යෝජනා කරනවා

උමා එය රැක ගැනිම අපේ වගකිමයි.මේ තුළින් නව රැකියා උත්පාදනය කර ගත හැකි යෝජනා මා ඉදිරියේ දි ඉදිරිපත් කිරිමට කටයුතු කරනවා.

අලුතින් නව ව්‍යාපාරික ස්ථාන බිහි වෙලා තියෙනවා.මෙය වැලිමඩ නගරය සංවර්ධනය කිරිමට විශාල බාධාවත් වනවා.මේ නිසා අනවසරව ඉදිකර ඇති ව්‍යාපාරික ස්ථාන සම්බන්ධව ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී ප්‍රභාත් රවින්ද්‍ර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,වැලිමඩ ගොවි ජනතාවගේ ප්‍රධානතම ආදායම් උත්පාදන මාර්ගය වන්නේ අර්තාපල් වගාවයි. මේ නිසාම මේ සභාව ආරම්භයේදිම වැලිමඩ ගොවි ජනතාව සම්බන්ධයෙන් මා කතා කලා.එහි දි මා කියා සිටියේ ගොවි ජනතාවට එළවළු සඳහා සාධරණ මැදිහත්වීමත් සිදු කර ගොවියාට එළවළු සඳහා සාධාරණ මිලක් ලබා දෙන ලෙසයි.එවිට ඔබතුමා කියා සිටියේ දේශිය අර්තාපල් මිල වැඩි කිරිමට නම් විදේශයෙන් ගෙන එන ආර්තාපල් සඳහා බදු මුදල වැඩි කල යුතු බවයි. මෙවන විට බදු මුදල වැඩි කර ඇතත් නිසි වේලාවට එය සිදු නොවුන බව මාගේ අදහසයි. අදවන විට ගොවියා අල වගාවෙන් ඈත් වි සිටිනවා. එපමණක් නොව අර්තාපල් මිල පහළ වැටිමත් සමඟ අනෙකුත් එළවළු මිල ද අඩුවි ඇත. මේ නිස ගොවියාට නිෂ්පාදන පිරිවැයවත් ලබා ගැනිමට නොහැකි වි ඇති බැවින් ඉදිරියේ දි සියලුම ගොවින්හට අස්වැසුමවත් ලබාදෙන ලෙස මා ඉල්ලා සිටිනවා.

එසේම කැප්පෙටිපොළ නගරයේ විදි පහන් දැල් විම් නිසි ආකාරයට සිදු වන්නේ නෑ.මේ පිළිබඳවත් සොයා බලන ලෙස මා ඉල්ලා සිටින අතරම අවශ්‍ය තැන් සඳහා විදි පහන් ලබා දෙන ලෙසත් ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශිය සභා අජිත් ප්‍රේමලාල් මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මම මේ සභාවට තෝරා පත් කිරිමට සහයෝගය ලබා දුන් මාගේ ගම් වැසියන්ටත්,පක්ෂ නායක රවී සමරවීර මැතිතුමාටත්,එම මැතිනියටත්,මාගේ ස්තුතිය පුද කර සිටිනවා.එසේම පසුගිය ආණ්ඩුව විසින් ලක්ෂ 26 ක මුදලක් යොදවා ගම අසලට ජලය ලබා දුන්නද ගැමි දිරිය ව්‍යාපෘතිය හේතුවෙන් ගමට ජලය ලබා ගැනිමට නොහැකි විය.එබැවින් අපේ ගමේ ජල ගැටළුව සභාව විසින් විසදිය නොහැකි නම් අමාත්‍යාශය හරහා හෝ එය විසඳා දෙන මෙන් මා ඉල්ලා සිටිනවා.තවද,

- ✓ වැලිමඩ නගරයට ආ හැකි කෙටි මාර්ගයක් වන නැදුන්ගමුව,කොස්ගහකුඹුර,ඇල්ල අරාව මාර්ගය සංවර්ධනය කිරිම පිළිබඳවත්,
- ✓ වැලිමඩ පොළ භූමියේ නළ ළිඳ අසළ ඇති අනාරක්ෂිත විදුලි රැහැන් හේතුවෙන් අනතුරු සිදුවිය හැකි බැවින්, ඒ පිළිබඳවත්,
- ✓ ප්‍රධාන වැසිකිළියේ ජලය කාන්දුවක් සිදුවන අතර ඒ පිළිබඳවත්
- ✓ එහි ජල කරාමය කැඩි ගොස් තිබෙන බැවින් ඒ පිළිබඳවත්,
- ✓ පොළ භූමියේ ආරක්ෂිත වැට හා එහි විදුලි බල්බ අක්‍රිය වි ඇති බැවින් ඒ පිළිබඳවත්,
- ✓ පොළෙහි වෙළඳාම් කටයුතු අවසන් වූ පසු ඒවා නිසි ආකාරව නැවත තබා යන ලෙස වෙළඳුන් දැනුවත්

කරන ලෙසත්

- ✓ පෙල භූමියට පිවිසෙන මාර්ගය අවහිර වන සේ වාහන නවතා වෙළඳාම් කටයුතු සිදු කරන බැවින් පාරිභෝගිකයින් අපහසුතාවයන්ට මුහුණ දෙනවා.එම නිසා ඒ පිළිබඳවත්,
- ✓ මීට පෙර පැවති සභාවේ දි ආරම්භ කල කුඩ ක්‍රමය අද වන විට අවිධිමත්ව භාවිතාවන බවක් දක්නට ලැබෙන බැවින්,ඒ පිළිබඳව වාර්තාවක් ලබා ගැනිමට කටයුතු කරන ලෙසත්
- ✓ වැලිමඩ ප්‍රාදේශිය සභාව සතු ඉඩම් අනවසරයෙන් අත්පත් කරගෙන කටයුතු කරන ආකාරයක් දක්නට ලැබෙනවා. මේ නිසා සභාව මැදිහත් වි සභාව සතු ඉඩම් හදුනාගෙන ඒවා ආදායම් උත්පාදනය කළ හැකි වැඩපිළිවෙළක් සකසන ලෙස මා ඉල්ලා සිටිනවා.
- ✓ පදික වෙළදාම් කරන අයට කඩ කාමර ලබා දුනන්ද නැවත ඔවුන් විසින් නගරයේ පදික වෙලදාම සිදු කරනවා.මේ නිසා ඒ පිළිබඳවත්,

ඒ අනුව ඉහත සදහන් කාරණා කෙරෙහි ඔබතුමාගේ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා

**ගරු ප්‍රාදේශිය සභා එම්.එම්.සෝමසිරි බණ්ඩාර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,. එක් කොට්ඨාශයනින් ඉදිරිපත් කළ හැක්කේ එක් යෝජනාවක් පමණක් දැයි පැහැදිලි කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.එම්.දයාරත්න මැතිතුමා**

ගරු සභාපතිතුමනි,මා මාලිගාතැන්න කොට්ඨාශය නියෝජනය කරන අතර එහි සිටින වතුකරයේ ජනතාවගේ ප්‍රශ්න සම්බන්ධයෙන් ඉදිරි සභාවන්හිදී කථා කිරිමට අපේක්ෂා කරනවා.ඒ වගේම මාලිගාතැන්න කොට්ඨාශය පුළුල් පරාසයක විහිදි ඇති බැවින් මේ ප්‍රදේශය සම්බන්ධයෙන් ඔබතුමාගේ විශේෂ අවධානය යොමු කරන ලෙස මා ඉල්ලා සිටිනවා.එසේම දැනට ඉදි කිරිම් කර ඇති බොරලන්ද හෙල බොජුන් හලේ වහලය සකස් කර එහි කටයුතු ආරම්භ කරන ලෙසත් ඉල්ලා සිටිනවා.තවද පොළභූමියේ කොන්ක්‍රීට් කර ඇති කොටසේ පිටු පස ඇති ප්‍රදේශය ඩෝසරය දමා සකස් කිරීමට හා පොළ මැද ඇති ලොරි දෙක පැත්තකට කිරිමටත් කටයුතු සලසන ලෙස ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී තුවාන් කාසිම් මැතිතුමා,**

ගරු සභාපතිතුමනි,සභාව පටන් ගෙන මාස හතරක් ගත වුවත් භාෂා පරිවර්තක කෙනෙක් නොමැතිවීම පිළිබඳව මා කණගාටුව ප්‍රකාශ කර සිටිනවා.තවද ඕහිය ප්‍රාදේශයේ නියෝජනය කරන මන්ත්‍රිතුමිය විසින් මන්ත්‍රිවරුන්ගේ අදහස් දැක්විමේදි කරුණු කිහිපයක් ඉදිරිපත් කලත් වාර්තාවේ එය කෙටි කර දක්වා ඇත.

ඔබතුමා විසින් සැප්තැම්බර් මස 09 වන දිනට පෙර එක් කොට්ඨාශයක් සඳහා එක් සංවර්ධන යෝජනාවක් ලබා දෙන ලෙස කියා සිටියා. මෙහි දි ගුරුතලාව බහු කොට්ඨාශයක් නිසාත්, මන්ත්‍රීධූර 05ක් සිටින නිසාත්, යෝජනා ඉදිරිපත් කරන ආකාරය පැහැදිලි කරන ලෙසත්, මහතැන්න හා බෝගහකුඹුර යන පාරවල් සෑදීමට විශාල මුදල් යොදවා තිබුණත් එම පාරවල් නිසි ආකාරයට සකස් නොවන බැවින් ඉදිරි කටයුතු අවසන් වීමට පෙර සොයා බලා කටයුතු කරන ලෙසත් මා ඉල්ලා සිටිනවා. තවද බෝගහකුඹුර උපකාර්යාලය අසල ඇති වැසිකිළිය සඳහා විදුලිය නොමැති බැවින් රාත්‍රි කාලයේ ධාවනය වන දුර සේවා බස් රථවලින් පැමිණෙන කාන්තාවන් අපහසුතාවයට පත්වෙනවා .මේ නිසා මේ පිළිබඳව සොයා බලන ලෙස හා හතරේ කණුව සඳහා ඇති විදුලි ලාම්පු තව වැඩි කරන ලෙස මා ඉල්ලා සිටිනවා. තවද සභාව පැවැත්වෙන කාලය දීර්ඝ බැවින් සභාව පැවැත්වෙන අතරතුරදී විවේක කාලයක් ලබා දෙන ලෙස ඉල්ලා සිටින අතර උදේ තේ සඳහා මන්ත්‍රීවරුන් එකතුවී රු:1000.00 ක මුදලක් වැය කර එම කටයුත්ත සිදු කරගනිමු යැයි මා ඉල්ලා සිටිනවා.

**ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී.පී.ඥානපාල සේනාධීර මැතිතුමා**

ගරු සභාපතිතුමනි,තුවාන් මන්ත්‍රීතුමා මහතැන්න හා බෝගහකුඹුර මාර්ග සැකසිම පිළිබඳව කථා කලා.මේ නිසා මේ පිළිබඳ ගැටලුවක් තිබේ නම් පරීක්ෂණයක් කිරීමට අදාළ මැදිහත්වීම සිදු කර ගන්නා ලෙස මම එතුමාට කියා සිටිනවා.බෝගහකුඹුර නගරයද අවිධිමත් නගරයක් බැවින් එය විධිමත්ව සෑදීමට සභාවක්,ආණ්ඩුවක් ලෙස සැලසුම් සකස් කරන විට නගරෙ පැත්තෙන් විරෝධතා මතු වෙනවා.ඒ නිසා සභාව පැත්තෙන් මේ ප්‍රශ්න මතු වෙනවදෝ කියලා මට හිතෙනවා. අපි හැමෝම එක තැන ඉදලා ජාති භේදයකින් තොරව කටයුතු සිදු කරගෙන යමු කියන යෝජනාව තුවාන් කාසිම් මැතිතුමාට මම කියා සිටිනවා.

**ගරු සභාපති ඩී.එම්.අජිත් කුමාර මැතිතුමා,**

ගරු මන්ත්‍රිවරුන් හත් දෙනෙකු විසින් ඉතා වටිනා අදහස් හා යෝජනා ඉදිරිපත් කරනු ලැබුවා.ඒ සඳහා මා එම මන්ත්‍රිවරුන්ට ස්තුතිය පුද කර සිටිනවා.

තාහිර් මන්ත්‍රිතුමා වරිපනම් බදු , ආයුර්වේද බෙහෙත් ශාලාවේ,වාහන තදබදය අනවසර ඉදිකිරීම් යන ප්‍රශ්න පිළිබඳව අදහස් දැක්වූවා.ගරු මන්ත්‍රීතුමනි, සභා දේපල අවුරුදු 15 කට පසු තක්සේරු කිරීමෙන් අනතුරුව තක්සේරු වටිනාකම අනුව වරිපනම් නියම වෙලා තියෙනවා.ඒ අනුව මේ අයවීම් සිදු වන බව හා කිසිදු ව්‍යාපාරිකයකුට සභාව පැත්තෙන් අසාධාරණයක් සිදුවෙලා නෑ. ඒ වගේම එම තක්සේරුවලට එකඟ වෙන්න බැරි ව්‍යාපාරිකයන්හට වෙනම දන්වා ඔවුන් විසින් අභියාචනා ඉදිරිපත් කිරීමෙන් පසු තක්සේරු දෙපාර්තමේන්තුවේ නිලධාරින් ගෙන්වා මේ පිළිබඳ සාකච්ඡාවක් සිදු කර වෙනස් කිරීමට හැකි තැන් වෙනස් කිරීමටත්,සමහර තැන්වල ඒ වරිපනම් බද්ද ඒ ආකාරයටම තැබීමටත්, යෝජනා කර ගත්තා. ඒ වගේම ව්‍යාපාරිකයන් සමඟ පසුගිය වාරයේ සිදු වූ සාකච්ජාවත් එක්ක ඔවුන් විසින් සියලු වරිපනම් හිඟතාවයකින් තොරව ගෙවීමට එකඟ වුණා. බදුල්ල දිස්ත්‍රික්කයේ පළාත් පාලන දිස්ත්‍රික්ක 18ක් ඇති බව හා ඒවායින් අඩුම වරිපනම් ප්‍රතිශතය වන 3.5% ක් තිබෙන්නේ මෙම ආයතනයේ පමණක්ය.

වැලිමඩ නගරයේ පවතින ආයුර්වේද ව්‍යාපාරයේ නීති විරෝධී මත්ද්‍රව්‍ය අලෙවි කරන බව කියන කාරණාවට අදාළව ඇති විරෝධය පිළිබඳව පොලිසියට පැමිණිලි සිදු කර තිබේ නම් එහි පිටපතක්ද ලබා දෙන්න.එවිට ඒවා පාදක කර ගනිමින් ඊට අදාළ මැදිහත්වීම කළ හැකි වේ.තවද වැලිමඩ නගරයේ වාහන තදබදය සඳහා ගරු ආණ්ඩුකාරතුමා හා සාකච්ජාවක් පැවැත්වූවා. එහිදී එතුමා මේ ප්‍රශ්නය පිළිබඳව ප්‍රාදේශීය ලේකම් ඇතුළු කණ්ඩායම සමඟ සාකච්ජාවක් පැවැත්වීමට ඉදිරියේදී දිනයක් ලබා දෙන බව පවසා සිටියා. වාහන නැවැත්වීමට රථගාල් ඉදිකිරීමට ස්ථාන කිහිපයක් මේවන විට හදුනා ගෙන ඇති අතර ලබන අවුරුද්දේදී අයවැයට ඇතුළත් කර ඒ සම්බන්ධයෙන් කටයුතු සිදු කිරීමට නියමිතය.ඒ වගේම වැලිමඩ නගරයේ අනවසර ඉදිකිරීම් ප්‍රශ්න තිබෙනවා .මින් ඉදිරියට කිසි කෙනෙකුට අනවසර ඉදිකිරීම් කිරීමට ලබා නොදෙන බව හා ඉවත් කළ හැකි සෑම තැනකම අනවසර ඉදිකිරීම් ඉවත් කිරීමට කටයුතු කරනවා.

ඒ වගේම ප්‍රභාත් මන්ත්‍රීතුමා අර්තාපල් වගාව පිළිබඳ ප්‍රශ්නය කථා කළා.අපේ ආසනයේ සෑම පුරවැසියෙක්ටම අර්තාපල් මිල සම්බන්ධ ප්‍රශ්නය තියෙනවා. ඒ නිසාම කෘෂි කර්ම අමාත්‍යාංශය,වෙළඳ අමාත්‍යාංශය , ආර්ථික සංවර්ධන අමාත්‍යාංශය යන අමාත්‍යාංශත් එක්ක මේ පිළිබඳව සාකච්ජා කරලා මේවන විට රු.60.00ක බද්ද රු.80.00 දක්වා වැඩි කර පෙරේදා ඊට අදාළ ගැසට් නිවේදනය නිකුත් කළා .මේ අනුව ඉදිරි දිනවලදී අර්තාපල් සඳහා සධාරණ මිලක් ලබා ගත හැකිය.එසේම ඔබතුමා සභාවේ වාහන පෞද්ගලික ස්ථාන වල නවතා තැබීම පිළිබඳව කථා කළා . මේ පිළිබඳව තොරතුරු නිශ්චිතව ලබා දෙන්න.එවිට ඒ සඳහා අදාල මැදිහත් වීම් සිදු කල හැකිය.

තවද අජිත් ප්‍රේමලාල් මන්ත්‍රීතුමා ලන්දේ ගම ජල ප්‍රශ්නය පිළිබඳව කථා කළා.චන්දක මන්ත්‍රීතුමාගේ පැත්තෙනුත් මේ යෝජනාව ලැබුණා. ඊට අදාළ මැදිහත්වීම මේවන විට සිදු කරමින් සිටිනවා.පොළේ වැසිකිළි සම්බන්ධව කථා කළා. ඇසල පෝය නිමිති කර ගෙන පැවති පිරිත් වැඩ සටහන සඳහා වැසිකිළි පද්ධතිය අළුත්වැඩියා සිදු කළා.ඒ වාගේම පොළට එන කණ්ඩායම වැසිකිළි පාවිච්චි කරන බැවින් "අපේ දේපල

රුකගනිමු “යන අදහසක් පොළ සංගමයට ඉදිරිපත් කිරීමටත්,ඒ වගේම විදුලි ගැටලුව සඳහා සැප්තැම්බර් මස අවසන් වීමට කලින් මැදිහත්වී කටයුතු කරන බව හා කුඩ ප්‍රශ්නය සඳහා ඉදිරි සභාව සඳහා ප්‍රශ්නාවලියක් ඉදිරිපත් කරන ලෙසත් මා කියා සිටිනවා.පොළේ අපිළිවෙල පිළිබඳව ඔබතුමා ප්‍රකාශ කළා, ඔබතුමා ඒ සඳහා පොළ සම්බන්ධ රැස්වීමකදී ඒ අයත් සමඟ කථා කරලා යම් ප්‍රමාණයකට හරි නිවැරදි කර ගැනිමට අදාළ මැදිහත්වීම කරන්න.සභාවේ ඉඩම් ගැටළු පිළිබඳවත්, කථා කළා.එම ඉඩම්වල ප්‍රශ්න ,ගැටළු හදුනා ගැනිමට හා එම ඉඩම්වල සංවර්ධන කටයුතු කිරීමට සමීක්ෂණ මට්ටමේ කටයුතු මේවන විට සිදු කරමින් පවතිනවා.තවද පදික කඩ පිළිබඳව අදහස් දැක්වූවා දැනට තියෙන පදික කඩ විධිමත් කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කරමින් පවතිනවා.ඒ වගේම නව පදික වෙළඳාම් කරන තැන් තියෙනව බව ඔබතුමා පැවසුවා. ඒ අදාල ස්ථාන සහ පුද්ගලයන් පිළිබඳව වාර්තාවක් ලබා දෙන්න එවිට අපිට ඒ අයව ඉවත් කිරීමට අවශ්‍ය මැදිහත්වීම් කටයුතු සිදු කළ හැකිය.ඒ වගේම කිසිම හේතුවක් නිසා අළුතින් නගරය ඇතුලේ පදික වෙළඳාම් කරන්න අවස්ථාවක් ලබා දෙන්නේ නැහැ.

බණ්ඩාර මන්ත්‍රීතුමා පැත්තෙන් පැවසුවා කොට්ඨාශයට එක් යෝජනාවක්ද කියලා. පළාත් පාලන ආයතන තුළ ප්‍රාදේශීය සභාවක මන්ත්‍රීවරු මැදිහත් වෙන්නෙ කොට්ඨාශ ක්‍රමය තුළය. ඒ නිසා කොට්ඨාශයක් සඳහා සැලකිය යුතු ප්‍රතිපාදන ප්‍රමාණයක් වෙන් කරන බැවින් අදාළ කොට්ඨාශයේ මන්ත්‍රීවරු එකතු වී හොද සංවර්ධන යෝජනාවක් ඉදිරිපත් කරන ලෙස මා ඉල්ලා සිටිනවා.

තවද දයාරත්න මන්ත්‍රීතුමා වතුකරයේ ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව හා බොරලන්ද හෙල බොජුන්හල පිළිබඳව කථා කළා. අපේ සහෝදර ද්‍රවිඩ ජනතාවගේ ප්‍රශ්න පිළිබඳව ද සභාවක් ලෙස අපි මැදිහත්වී කටයුතු කරන බව හා හෙල බොජුන්හල සැප්තැම්බර් මස 10 වන දිනත් 15 වන දිනත් අතර විවෘත කිරීමට හැකිය.

එසේම තුවාන් කාසිම් මන්ත්‍රීතුමා භාෂා පරිවර්තකයෙක් අවශ්‍ය බව පැවසුවා. අපිත් ජාතික සමගිය අගයන,හැමෝගේම සාධාරණත්වයට මැදිහත් වන දේශපාලන ව්‍යාපාරයක් ලෙස මේ පිළිබඳව අදහස අපිටත් තියෙනවා. නමුත් පවතින නීති රාමුව තුළ අදාළ කටයුතු සිදු කළ යුතු බැවින් ඒ මැදිහත් වීම සිදු කරගෙන යමින් පවතිනවා.ඒ වගේම වාර්තාව ගැන කථා කළා.වාර්තාවේ මන්ත්‍රීවරුන්ගේ අදහස් දැක්වීම එලෙසම සටහන් කිරීමට අවශ්‍ය නැත .මේ නිසා එහි සංෂිප්තයක් සඳහන් කර තියෙනවා.තවද ඔබ කුමන පක්ෂයේ සිටියත් සංවර්ධන කටයුතු පිළිබඳව ඇති අක්‍රමිකතාවයක් තිබේ නම් ඒ පිළිබඳව ලිඛිතව දැනුම් දෙන්න. ඒ වගේම බෝගහකුඹුර වැසිකිළිය පිළිබඳව කථා කළා. මෙම ඉදිකිරීම සිදු කර ඇත්තේ නොගැලපෙන ස්ථානයක ය. මේ නිසා වෙනත් ස්ථානයකට මෙය ගෙන යාමට අවශ්‍ය කටයුතු සිදු කරමින් සිටිනවා. ඒ වගේම තුවාන් මන්ත්‍රීතුමනි සභාව විසින් තේ වේලක් ලබා දෙන බැවින් එය ලබා ගන්නා ලෙසත් සභාව අවසන් වී නිවසට යනවිට මන්ත්‍රීතුමන්ලා එකතු වී රු:1000.00 බැගින් එකතුකර තේ සඳහා වැය කරගන්න. තවද සෑම පුස්තකාලයකටම පුස්තකාල කමිටු සාදා ඒවා විධිමත් කිරීමේ කටයුතු හා බොරලන්ද, බෝගහකුඹුර,කැප්පෙටිපොළ යන පුස්තකාල තුළ පාඨක සමාජ බිහි කර ඇති අතර ප්‍රධාන කාර්යාලයේ හා ඩයරබා උප කාර්යාලයේ ද ඒ සඳහා මැදිහත්වීමට අවශ්‍ය කටයුතු සිදු කරමින් පවතිනවා.තව මාසයක් දෙකක් වන විට පුස්තකාල තිබුණට වඩා දියුණු තත්වයට පත්වෙන බවට විශ්වාසයක් තිබෙන බව මා පවසා සිටිනවා

එසේම .ඥානපාල මන්ත්‍රීතුමාගේ අදහස් දැක්වීමටත් ස්තුතිවන්ත වෙනවා.

ඉන් අනතුරුව ගරු සභාපතිතුමන් විසින් පැමිණ සිටි සියලු දෙනාට ස්තුති කරමින් සහභාගි වු සියලු මන්ත්‍රීවරුන්ටත් ,කාර්ය මණ්ඩලයටත්, ,ව්‍යාපාරික මහතුන්ටත්,මාධ්‍යවේදී මහතුන්හට හා උපකාර කළ සියලු දෙනාට ස්තූතිය පුද කර සිටින ලදි. මීළඟ සභාව 2025 සැප්තැම්බර් මස 25 වන දින පැවැත්විමට නියමිතව තිබු නමුත් පුස්තකාල ගීත රසාස්වාද වැඩසටහනක් එදින පැවැත්වෙන බැවින්, සැප්තැම්බර් 24 වන දින මහා සභා රැස්විම පැවැත්වෙන බව ගරු සභාපතිතුමා විසින් සභාවට දැනුම් දෙමින් සභාවේ වැඩ කටයුතු පෙ.ව 11. 30 ට පමණ නිමා කරන ලදි.

සභාපති,
ප්‍රාදේශීය සභාව,
වැලිමඩ

\

මෙම සභා වාර්තාව ................................................ වන දින පැවති මහ සභාවේ දි ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී ...................................................................මැතිතුමා/මැතිණියගේ යෝජනාවෙන් ගරු ප්‍රාදේශිය සභා මන්ත්‍රී/මන්ත්‍රීණී...................................................... මැතිතුමා/මැතිණියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව/බහුතර ඡන්දයෙන් සංශෝධනයන්ට යටත්ව සභා සම්මත විය.

.